# දූරියන් වගාව

**කතෘ**

ඩබ්.ඩී. ලෙස්ලි
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, හොරණ
ඉන්ද්‍රාණි මැදගොඩ

**සංස්කරණය**

ඩබ්.ඩී. ලෙස්ලි
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, හොරණ

**මෙහෙයවීම හා සම්බන්ධීකරණය**

එස්. පෙරියසාමි
වී.වී. බස්නායක

**නිර්මාණය**

එම්.ඩී. සමරකෝන්
ජේ.ආර්.බී. හේරත්
අනූෂා කන්නන්ගර

**පරිගණක පිටු සැකසුම**

තිළිණි මධූෂිකා
අසිත බස්නායක

**පිටකවර නිර්මාණය**

අසිත බස්නායක

**නිෂ්පාදන කළමණාකරු**

ආර්.යූ. රූපස්සර

**මුද්‍රණය**

කෘෂිකර්ම ප්‍රකාශන ඒකකයේ මුද්‍රණාලය

**ප්‍රකාශක**

තොරතුරු හා සන්නිවේදන අංශයේ කෘෂි ප්‍රකාශන ඒකකය
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම | 01 |
| උද්භිද විද්‍යාත්මක ලක්ෂණ | 02 |
| දේශගුණය හා පස | 05 |
| නිර්දේශිත ප්‍රභේද | 06 |
| පැළ නිෂ්පාදනය කර ගැනීම | 08 |
| භූමිය තෝරා ගැනීම හා සකස් කිරීම | 11 |
| පැළ සිටුවීම | 12 |
| පොහොර යෙදීම | 13 |
| ශාකය පුහුණු කිරීම, කප්පාදුව හා නඩත්තුව | 15 |
| පුෂ්ප පරාගණය | 17 |
| රෝග හා පළිබෝධ පාලනය | 19 |
| ඵල තුනී කිරීම | 27 |
| අස්වැන්න සහ අස්වනු නෙලීම | 27 |
| පසු අස්වනු තාක්ෂණය | 28 |

## හැඳින්වීම



ලෝකයේ සර්ම කලාපික පලතුරු වල රජු වශයෙන් හැඳින්වෙන දූරියන්, වෙළඳපොළෙහි ඇති පලතුරු අතරින් පෝෂණයෙන් ඉහළ රසවත්, ජනප්‍රිය පලතුරකි. දූරියන් පිළිබඳ පරිශීලනය කිරීමේදී එය 16 වන සියවසෙහි සිට පැවත එන බැව් හෙළිවී ඇත. මෙම බෝගය ගිණිකොණ දිග ආසියාවේ මැලේසියානු අර්ධද්වීපයෙහි සම්භවය වුවද ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව, දකුණු ඉන්දියාව, මියන්මාරය, වියට්නාමය, පිලිපීනය, නිව්ගිනියාව හා ජැමෙයිකාව යන රටවලට ව්‍යාප්ත වී ඇත. 1850 දී මැලේසියාවෙන් මෙරටට හඳුන්වාදුන් ප්‍රථම දූරියන් ශාකය පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයෙහි රෝපණය කර ඇති බැව් වාර්තා වී ඇත.

## සම්භවය

දූරියන් බොම්බාකේසියේ (Bombacaceae) කුලයට අයත් වන අතර එහි උද්භිද විද්‍යාත්මක නාමය වන්නේ දූරියෝ සිබෙතිනස් (*Durio zibethinus*) ය. තවද වෙනත් රටවල විවිධ නම් වලින් දූරියන් හඳුන්වන නමුදු Zebetto (සිබෙටෝ) යන ලතින් වචනයෙන් (දැඩි) සැර යනුවෙන් ද මැලේ භාෂාවෙන් Duri (දූරි) යනුවෙන් කටු ද හැඳින්වේ. මෙම ලතින් මැලේ භාෂා සම්මිශ්‍රණයක් ලෙස ඉහත නම ව්‍යවහාරවන අතර මෙම ශාකයෙහි ප්‍රධාන ලක්ෂණ මෙම වචන වලින් විද්‍යාමාන වේ.

## ව්‍යාප්තිය

දූරියන් වාණිජ වගාවක් වශයෙන් වගා කිරීම හා අපනයනය පිළිබඳව තායිලන්තය ප්‍රමුඛත්වයක් ගනියි. තායිලන්තයේ බොහෝ වර්ග ඇති අතර ඵලයෙහි හැඩය, මදුලෙහි පැහැය හා සොයාගත් ස්ථානය අනුව ඒවා වර්ග කර ඇත. ශ්‍රී ලංකාවේ මහනුවර, කෑගල්ල, කළුතර, ගම්පහ, මාතලේ, රත්නපුර, ගාල්ල සහ මාතර යන ප්‍රදේශවල දූරියන් වැඩි වශයෙන් වගා කෙරේ. මෙය තෙත් කලාපීය බෝගයක් වුවත් බදුල්ල, මොණරාගල හා නුවරඑළිය වැනි දිස්ත්‍රික්කයන්හි මැදරට හා උඩරට අන්තර් කලාප වලද එය වගා කළ හැකි බව පර්යේෂණ දත්ත පෙන්වා දී ඇත. බොහෝ විට මේවා ගෙවතු වල ඇති අතර ව්‍යාප්තිය සිදුවී ඇත්තේ බීජ මඟිනි. එබැවින් විවිධත්වයක් පෙන්නුම් කරයි.

## වර්ගීකරණය :

රාජධානිය (Kingdom) - Plantae

උප රාජධානිය ( Sub Kingdom) - Tracheobionta (Vascular plants)

විශේෂ කාණ්ඩය (Super division) - Spermatophyta (Seed plants)

කාණ්ඩය (Division) - Magnoliophyta (Flowering plants)

පන්තිය (Class) - Magnoliopsida (Dicotyledanae)

උප පන්තිය (Sub class) - Dilleniidae

වර්ගය (Order) - Malvales

කුලය (Family) - Bombacaceae

ගෝත්‍රය (Tribe) - Durioneae

ඝණය (Genus) - *Durio* Adanson

විශේෂය (Species) - *Durio zibethinus* Murr.

## උද්භිද විද්‍යාත්මක ලක්ෂණ

වසර 80 - 150 ක ජීවී කාලයක් ඇති මෙය ඒක ගෘහී, ද්වී බීජ පත්‍රී ශාකයකි. මීටර් 25 - 50 ක් දක්වා උසකට වර්ධනය වේ. කඳෙහි පොත්ත රළු වන අතර එය දුඹුරු පැහැතිය. කාෂ්ඨීය කොටස දැඩි බවින් අඩුය. ප්‍රධාන කඳෙන් නොයෙක් දිශාවනට අතු විහිදී පවතී. අතු විහිදීම ප්‍රභේදය අනුව හා සූර්යාලෝකයේ බලපෑම මත සිදුවේ. මෙම අතු විහිදීම බීජ පැළ හා බද්ධ පැළ අනුව වෙනස් වේ. බොහෝ විට බීජ පැළයක් තරමක් උස්ව වැඩී ප්‍රධාන අතු විහිදීමක් දක්නට ලැබේ.

නමුත් බද්ධ පැළයක අතු විහිදීම ශාකයේ පහත සිටම සිදුවේ. පත්‍ර උඩු තලය දිලිසෙන අතර තද කොළ පැහැතිය. පත්‍ර යටි තලය ලා දුඹුරු පැහැතිය. සරල පත්‍ර වලින් සමන්විතය. පත්‍ර නටුව සෙන්ටි මීටර් 1 - 2.5 ක් පමණ දිග වන අතර රවුම්ය. ප්‍රභේද අනුව පත්‍රයේ දිග වෙනස් වේ. පත්‍ර අග්‍රය තියුණුය. පත්‍ර අග්‍ර වල හැඩයන් සහ පත්‍ර පාද වල හැඩයන් ප්‍රභේද අනුව වෙනස්කම් පෙන්වයි. පත්‍රයේ දිග හා පළල පිළිවෙලින් සෙන්ටිමීටර් 10 - 20 අතර සහ සෙන්ටිමීටර් 2 - 8 අතර වේ. ලපටි පත්‍ර පළමුව මැද නාරටියෙන් හැකිලී පවතින අතර පත්‍ර මෝරන විට දිග හැරේ. ශාක වියනේ හැඩය, ප්‍රභේදය අනුව වෙනස්කම් පෙන්වයි. බොහෝ විට පිරමීඩාකාර, ඕවලාකාර හෝ පැතුරුණු හැඩයන් දක්නට ඇත. අතු විහිදීමේ හැඩය එක් එක් වර්ග අනුව වෙනස් වේ.



**දූරියන් මේරූ පත්‍ර, ප්‍රමාණය, හැඩය සහ වර්ග අනුව වෙනස්කම්**

දූරියන් බීජ පැළයක කඳෙන් පහළට එක් ප්‍රාථමික මුදුන් මුලක් හටගන්නා අතර ඉන් ද්විතීයික මුල්ද එයිනුත් තෘතීයික මුල්ද හට ගනියි. මූල කේෂ නොමැත. ද්විතීයික හා තෘතියික මුල්වලින් හටගන්නා සෙන්ටිමීටර් 50 ට අඩු ගැඹුරකින් පස මතුපිට ආසන්නයෙහි පවතින (දිලීරක) මුල් මගින් ජලය හා පෝෂක උරාගනී.



**බීජ මගින් හටගත් විශාල ගසක්**



දූරියන් බද්ධ ශාකයක්

## පුෂ්ප

දූරියන් පුෂ්ප පොකුරු වශයෙන් අතුවලින් හටගනී. ප්‍රධාන කඳේ මල් හට නොගනී. පොකුරක සාමාන්‍යයෙන් මල් 25 ක් පමණ හටගන්නා අතර එය 3 සිට 75 දක්වා වෙනස් විය හැකිය. වාර්තා වී ඇති කරුණු අනුව එක් වාරයකදී එක් ගසකින් මල් 20000-40000 පමණ නිෂ්පාදනය වේ. පුමාංගි හා ජායාංගි කොටස් එකම මලෙහි පිහිටා තිබීම නිසා මෙම මල සම්පූර්ණ හෝ (පරිපූර්ණ) ද්වී ලිංගික මලක් වේ.

පුෂ්ප නටුවේ දිග සෙන්ටි මීටර් 1 - 7 ක් පමණ වන අතර එය ප්‍රභේද අනුව වෙනස් විය හැකිය. මල් පොහොට්ටුවෙහි හැඩය රවුම් හෝ කෝණාකාර විය හැක. මුල් කාලයේ උප මණියෙන් සම්පූර්ණ මලම වැසී ඇති අතර පසුව එය කොටස් වලට (2 ට හෝ 4 ට) ඛණ්ඩනය වේ. එහි වර්ණය කොළ හෝ කොළ මිශ්‍ර කහ පැහැයක් ගනී. මණිපත්‍ර 5 බද්ධ වී පිහිටයි. බොහෝ විට මුකුටයේ පෙති 5 ක් පිහිටන අතර සුදු පැහැයට හුරු ක්‍රීම් වර්ණයක් ගනී. ප්‍රභේද අනුව කහ මිශ්‍ර තැඹිලි පැහැය දක්වා වෙනස් වේ. ඒවායේ මැද කොටසින් සම්බන්ධ වී පසුව ඒවා එකවර හැලී යයි.

පුෂ්ප පාදස්ථයේ මධු කෝෂ ඇත. පරාගධානි සම්බන්ධ රේණු කාණ්ඩ වශයෙන් පිහිටන අතර එවැනි කාණ්ඩ 4 - 6 ක් පිහිටයි. ඒ අනුව පරාගධානි 35 - 80 පමණ ඇත. තවද පරාගධානි සම්බන්ධ වී ඇති රේණු ඒකාකාරී මට්ටමක පිහිටා නැත. ඩිම්බ කෝෂය සම්බන්ධ වී ඇති කීලය, කහ හෝ තැඹිලි පැහැති කලංකයකින් කෙළවර වේ. මෙය පරාගධානිවලට ප්‍රථම පරිණත වීම (ප්‍රපුං ප්‍රජායා පරිණතිය) සිදු වේ.


මලේ විශාලත්වය, පොහොට්ටුවෙහි හැඩය, පරාගධානි සංඛ්‍යාව, පෙතිවල පැහැය, කලංකයේ පැහැය, ආදී ලක්ෂණ වලින් මල් අතර විවිධත්වයක් පෙන්වයි. එබැවින් මෙම ලක්ෂණ ප්‍රභේද වෙන් කොට හඳුනා ගැනීමට භාවිතා කළ හැකිය.




මල් පොහොට්ටු



විවෘත වූ පුෂ්ප




පුෂ්පයක කොටස්



පුෂ්ප විවෘත වන අවස්ථා

## ඵලය

ඵලාවරණය කටුවලින් යුක්තය. එය කොළ මිශ්‍ර කහ හෝ රන්වන් දුඹුරු පැහැ විය හැකිය. එමෙන්ම කටු ඝනත්වය සහ තියුණු බව ප්‍රභේද අනුව වෙනස් වේ. සාමාන්‍යයෙන් සෑම ඵලයකම අණ්ඩප 5 ක් ඇති අතර එහි මාංශලය මදුළු සහිතය. අණ්ඩප සංඛ්‍යාව වෙනස්වන අවස්ථා ද සුළු වශයෙන් දක්නට ලැබේ. සමහර අණ්ඩප පරාගනය අසාර්ථක වීමෙන් අසම්පූර්ණව ඇත. එම අවස්ථාවේදී මදුළු වර්ධනය වීමක් දක්නට නොලැබෙන අතර එවැනි අණ්ඩප කොටස් වල වර්ධනය අඩු බැවින් අක්‍රමවත් හැඩයකින් යුක්ත ඵල හට ගනී.

පරාගනය වී සති 4 කට පසුව මාංසලයේ වර්ධනය ආරම්භ වේ. බීජය මාංසලයෙන් ආවරණය වී ඇති අතර මාංසලය, ප්‍රභේද අනුව ක්‍රීම්, කහ හෝ තැඹිලි පැහැ වේ. ඵලය මෝරන විට මාංශලය මෘදු වේ. මාංශලයේ මෘදු හා තද ස්වභාවය අනුව දූරියන් වැල හෝ වරකා යනුවෙන් හඳුන්වයි. සාමාන්‍යයෙන් දූරියන් ගෙඩියක බර ග්‍රෑම් 500 සිට කිලෝ ග්‍රෑම් 5 දක්වා වෙනස් විය හැකිය. බීජ රහිත මදුළු වල මද බරෙහි ප්‍රතිශතය 25% - 75% ක් දක්වා වෙනස් විය හැක. දූරියන්වල ඇති ආවේණික ගන්ධය එහි ඇති සල්ෆයිඩ් සහ අනිකුත් රසායනික ද්‍රව්‍ය (Diethyldisulphide) මඟින් ඇති වේ.

දූරියන් බීජය හෘදයාකාර හැඩයක් ගන්නා අතර ප්‍රභේද අනුව හැඩය සහ ප්‍රමාණය වෙනස් වේ. සාමාන්‍යයෙන් හොඳින් මෝරන ලද බීජ කහවන් දුඹුරු හෝ රතුවන් දුඹුරු වේ.



දූරියන් එල වල විචලතාවය

## පෝෂණ සංයුතිය

මාංසල ග්‍රෑම් 100 ක පෝෂණීය අගය

| | |
|---|---|
| ශක්තිය (කිලෝ ජුල්) | 520 |
| ජලය (ග්‍රෑම්) | 66.8 |
| ප්‍රෝටීන් (ග්‍රෑම්) | 2.5 |
| මේදය (ග්‍රෑම්) | 1.6 |
| කාබෝහයිඩ්‍රේට් (ග්‍රෑම්) | 23.8 |
| ෆයිබර්/ කෙඳි (ග්‍රෑම්) | 1.4 |
| කැල්සියම් (මිලි ග්‍රෑම්) | 20 |
| ෆොස්පරස් (මිලි ග්‍රෑම්) | 63 |
| පොටෑසියම් (මිලි ග්‍රෑම්) | 601 |
| යකඩ (මිලි ග්‍රෑම්) | 0.9 |
| සෝඩියම් (ග්‍රෑම්) | 1.0 |
| තයමින් (මිලි ග්‍රෑම්) | 0.27 |
| රයිබොෆ්ලේවින් (මිලි ග්‍රෑම්) | 0.29 |
| විටමින් සී (මිලි ග්‍රෑම්) | 57 |
| බීටා කැරොටින් (මිලි ග්‍රෑම්) | 10 |

## ප්‍රයෝජන

වෙළඳපොළෙහි මිළ අධික පලතුරකි. කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන්, මේදය, ඛණිජ ලවණ සහ විටමින් වලින් අනූන වේ. තවද දූරියන් මදයෙන් ටොෆි, අයිස්ක්‍රීම්, දූරියන් චිප්ස්, දොදොල් හා කේක් වැනි රසකැවිලිද නිෂ්පාදනය කරනු ලැබේ. දූරියන් බීජය විශාල වන අතර එහි අධික කාබෝහයිඩ්‍රේට් සහ පෝෂක පදාර්ථ ඇත. බීජ විවිධ අන්දමින් එනම් තැම්බීමෙන්, රෝස් කිරීමෙන් ආහාරයට ගත හැකිය.

දූරියන් මදුලු සහිත ඇට වල කාමොද්දීපක ගුණ ඇති බව සඳහන් වේ. මෙහි පත්‍ර සහ මුල්වල සාදාගත් මිශ්‍රණය සෙංගමාලය හා උණ සඳහා ප්‍රතිකාරකයක් වශයෙන් යොදාගන්නා බව ද සඳහන් වේ.

දූරියන් ගසේ කඳ මීටර් 30 ක් පමණ උසට වැඩෙන අතර එය දැව සඳහා උපයෝගී කර ගනී. මෙහි දැවය සැහැල්ලු හා වටිනාකමින් අඩු වුවත් නොයෙක් ද්‍රව්‍ය සෑදීමට යොදා ගනී. මෙය පරිසර හිතකාමී සහ කෘෂි වන වගාවක් ලෙසද ප්‍රයෝජනයට ගත හැක.

## දේශගුණය හා පස

මුහුදු මට්ටමේ සිට මීටර් 600 - 900 (අඩි 2000 - 3000) උච්චත්වයක් දක්වා හොඳින් වගා කළ හැකි වුව ද අඩි 3000 ට වඩා උස බිම්වල අධික උසකින් වගා කිරීමේ දී එල හට ගැනීම අඩු වේ. උණුසුම් හා ආර්ද්‍රතාවය 75% - 80% දේශගුණික තත්ත්වය යටතේ දූරියන් ශාකය හොඳින් වර්ධනය වේ. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 1600 - 3000 ක් හා උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 24 - 30 ක් අතර වීම සුදුසුය.

හොඳ ජලවහනයකින් යුත් සමතලා බිම් හා සුළු බෑවුමක් සහිත බිම් දූරියන් වගාව සඳහා සුදුසු වේ. දූරියන් වල පෝෂක මුල් මතුපිට පස ආසන්නයේම තිබීම

නිසා මතුපිට පස සාරවත්ව තිබීම යෝග්‍ය වේ. පසෙහි pH අගය 5.0 - 6.5 ක් හා මීටර් 1.5 ක් පමණ ගැඹුරු, හොඳින් ජලය බැස යන ලෝම පසක් දූරියන් වගාවට සුදුසුය. පෝෂණ ඌණතා විශේෂයෙන්ම (යකඩ සහ සින්ක්) වැඩි pH අගයන්හිදී දැකගත හැකිය. ලවණ අධික පස වගා කිරීම සඳහා නුසුදුසුය. කාබනික ද්‍රව්‍ය බහුල වැලි ලෝම ඇලුවියල් පස දූරියන් බෝගයට හිතකර වේ. මැටි අධික හෝ අතිශයින්ම වැලි සහිත පසෙහි දූරියන් බෝගයෙහි වර්ධන වේගය අඩුවන අතර අස්වැන්න ද අඩුවේ. සාර්ථක වගාවක් සඳහා හොඳ පාංශු ව්‍යුහයක් හා කාර්යක්ෂම ජලවහනයක් අත්‍යාවශ්‍ය වේ. පසෙහි වැඩිපුර තෙතමනය කුඩා පැළවල වර්ධනය අඩුවීමට හේතු වේ. තවද රෝගී තත්ත්වයන් ඇති වීමට පහසු කරවයි.

## නිර්දේශිත ප්‍රභේද

අඹතැන්න, කසුන්, හොරණ ගෝල්ඩ්, හොරණ ජම්බෝ සහ ගන්නෝරුව ස්වීට් ලෙස දැනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශිත ප්‍රභේද පහක් ඇත.

### අඹතැන්න



මධ්‍යම ප්‍රමාණයේ ඵල දරණ අතර ඵලයක සාමාන්‍ය බර කිලෝ ග්‍රෑම් 1.6 ක් පමණ වේ. ඕවලාකාර ඵල දරයි. ක්‍රීම් පැහැයක් ගන්නා මාංසලය සාපේක්ෂව තද බවකින් යුක්තය.

### කසුන්



මධ්‍යම ප්‍රමාණයේ ඵල දරණ අතර ඵලයක සාමාන්‍ය බර කිලෝ ග්‍රෑම් 1.6 ක් පමණ වේ. ඕවලාකාරඵලදරයි.කහතැඹිලිපැහැයක්ගන්නා මාංසලය තද බවකින් යුක්තය.

### හොරණ ගෝල්ඩ්





මෙම ප්‍රභේදයේ ඵල අනෙකුත් ප්‍රභේදයන්ට සාපේක්ෂව විශාල වේ. ඵලයක සාමාන්‍ය බර කිලෝ ග්‍රෑම් 2.5 ක් පමණ වේ. ඕවලාකාර හැඩයකින් යුක්ත වන අතර ඵල කහ මිශ්‍ර හෝ ලා කොළ පැහැයෙන් යුක්තය. මාංසලය කහ පැහැයකින් යුක්තය. මාංසලය ඝනකමය. මාංසලය මධ්‍යස්ථ තද බවකින් යුක්තය.

## හොරණ ජම්බෝ



මෙම ප්‍රභේදයේ ඵල විශාල බවකින් යුක්තය. ඵලයක සාමාන්‍ය බර කිලෝ ග්‍රෑම් 2.8 ක් පමණ වේ. තරමක් රවුම් හැඩයක් ගන්නා අතර ගෙඩි, දාර බේරුණු ස්වභාවයක් පෙන්වයි.



ඵලය කොළ දුඹුරු පැහැයක් ගනී. මාංසලය ඉතාම වැඩිය. ඝනකමය. පුහු බීජ අධිකයි. මාංසලය මධ්‍යස්ථ තද වේ.

## ගන්නොරුව ස්වීට්





මෙම ප්‍රභේදයේ ගෙඩියක සාමාන්‍ය බර කිලෝ ග්‍රෑම් 2 - 4.5 අතර වේ. මදයේ වර්ණය කහ පැහැයට හුරු තැඹිලි පැහැයක් ගනී. පැණි රස ගතිය වැඩිය. මදයේ ඝණකම වැඩිය. එය සෙන්ටි මීටර් 1.5 - 1.9 ක් අතර වේ. ගෙඩිය පහසුවෙන් පලා මදය ඉවත් කර ගැනීමට හැකිය. මදයේ ඝනකම වැඩි නිසා මදුලු වල හැඩය වෙනස් වීමකින් තොරව ඉවත් කර ගත හැකිය. බද්ධ පැළ සිටුවා වසර 6 - 7 කින් අස්වනු ලබා දීම ආරම්භ වේ.

## පැළ නිෂ්පාදනය කර ගැනීම

දූරියන් ප්‍රචාරණය බීජ මඟින් හා වර්ධක ප්‍රචාරණ ක්‍රම මඟින් සිදුකර ගත හැකිය. කෙසේ වෙතත් අවුරුදු 4 - 5 වැනි කෙටි කාලයක දී එල ලබා ගත හැකි වීම, අනුජය ලබාගන්නා ගසේ ඇති එල වල ගුණාත්මයට සමාන ගුණාත්මයෙන් යුතු එල ලබා ගත හැකි වීම, පහළ සිට අතු පැතිරුණු සාපේක්ෂව කුඩා ගස් වල එල හටගන්නා බැවින් වාණිජ වගාවක් සඳහා වර්ධක ප්‍රචාරණ ක්‍රමයක් වන බද්ධ පැළ යොදා ගැනීම සුදුසුය. බීජ පැළ වලින් අස්වනු ලබාදීමට වැඩි කාලයක් ගත වන අතර (අවු. 10 - 12 පමණ) ලැබෙන පැළ ඒකාකාරී නොවන හෝ ගුණාත්මයෙන් වෙනස් විය හැකි බැවින් ද අස්වනු ලබන තෙක්ම එල වල ගුණාත්මක තත්ත්වය නොදන්නා බැවින් ද වාණිජ වගාවක් සඳහා යොදා ගැනීම නුසුදුසුය. එසේම එල හට ගන්නා කාලය ඉතා විචල්‍යය වේ.

## වර්ධක ප්‍රචාරණය

මෙය විවිධ ක්‍රම මඟින් එනම් අංකුර බද්ධය, රිකිලි බද්ධය, අතු බැඳීම වැනි ක්‍රම මඟින් සිදු කර ගත හැකිය. දූරියන් සඳහා සාර්ථකම වර්ධක ප්‍රචාරණ ක්‍රමය රිකිලි බද්ධය වේ. රිකිලි බද්ධ ක්‍රම අතුරින් කූඤ්ඤ බද්ධය දූරියන් සඳහා සාර්ථකම බද්ධ ක්‍රමය ලෙස හැඳින්විය හැකිය.

## කූඤ්ඤ බද්ධය

### ග්‍රාහකය සැකසීම

**(බීජ තෝරා ගැනීම, සකස් කිරීම හා ප්‍රරෝහණය)**

නීරෝගී ගසක හොඳින් පැසී ඉදුණු එල වලින් බීජ ලබා ගත යුතුය. මුලින්ම මදුළු වෙන්කර මදය ඉවත් කළ පසු මාංශල කොටස් ඉවත් වන තුරු බීජය හොඳින් සෝදා ගැනීම කළ යුතුය. පසුව අසම්පූර්ණ හා හානිවූ බීජ ඉවත් කර හොඳ බීජ පමණක් පවනේ වියළා ගත යුතුය. දූරියන් බීජ වල ජීව්‍යතාවය ඉක්මණින් පහළ බසින හෙයින් පවනේ වියළා ගත් විගස වැලි තවානක හෝ පොලිතින් බෑග්වල රෝපණය කළ යුතුය.


බීජ ප්‍රරෝහණය සඳහා දින 5-15 පමණ ගත වේ. බීජ ප්‍රරෝහණය වූ පසු මතුපිට පස්, වැලි හා කොම්පෝස්ට් 1:1:1 අනුපාතයෙන් මිශ්‍ර කොට සෙන්ටි මීටර් 15 - 20 පමණ විශ්කම්භය සහ සෙන්ටි මීටර් 20 - 30 උස ගේජ් 300 කළු පොලිතින් බෑග් වල පුරවා ඒවායේ රෝපණය කරන්න. (මුල් කුණුවීම වලක්වා ගැනීම සඳහා නොදිරූ කාබනික පොහොර භාවිතයෙන් වැළකීම අත්‍යවශ්‍යයි). බීජ සිටුවීමට ප්‍රථම දිලීර නාශකයකින් ප්‍රතිකාර කිරීම වැදගත් වේ.

## අනුජය සකස් කර ගැනීම

නිර්දේශිත ප්‍රභේදයකින් අනුජය තෝරා ගත යුතුය. එම අනුජය කොටස රූපයේ දැක්වෙන ආකාරයේ පත්‍ර කීපයක් සහිත විය යුතුය. පාර්ශ්වික අළුත් අතු රිකිළි අනුජය ලෙස ගත යුතු අතර අංකුර ලබා ගැනීම, අළුත් පත්‍ර මතුවීමට හෝ අංකුර පිපිරීමට පෙර සිදුකිරීම වඩාත් සුදුසුය. කපාගත් අනුජ රිකිල්ලේ අග්‍රස්ථයේ ඇති පත්‍ර 2 - 3 ක පමණ අඩක් ඉතිරි වන ලෙස පත්‍ර කපා දමන්න. ඊට පහළින් ඇති පත්‍ර වල නටු පමණක් ඉතිරි වන ලෙස පත්‍ර කපා ඉවත් කරන්න. පසුව අනුජයේ කැපුම් කෙළවර කූඤ්ඤයක් ආකාරයට කපා සකසා ගත යුතුය. මෙය සිදුකළ යුත්තේ බද්ධ කිරීමට සූදානම් වන අවස්ථාවේදීය.



අනුජය සඳහා සුදුසු රිකිල්ලක් තෝරා ගැනීම



වැඩිපුර පත්‍ර ඉවත් කර
අනුජය සකසා ගැනීම (පත්‍ර 3 -4)

## බද්ධය සිදුකිරීම

බීජ පැළ (ග්‍රාහක) සෙන්ටි මීටර් 15 ක් පමණ උස වන විට (එනම් සති 2 - 5 ත් අතර වයසැති) බද්ධය සිදුකළ හැකිය. මෙම අවස්ථාව වන විට බීජ පැළ පත්‍ර දෙකක් දක්වා වර්ධනය වී ඇත.

සාදාගත් ග්‍රාහක පැළයේ බීජ පියලි ග්‍රාහකයේ කඳට සම්බන්ධ වන ස්ථානයේ සිට සෙන්ටි මීටර් 2 - 5 ක් පමණ ඉහළ ස්ථානයකින් පැළය තිරස්ව තියුණු තලයකින් (බද්ධ පිහියකින්) කපා ගන්න. පසුව කඳේ කැපුම් පෘෂ්ඨයේ සිට සෙන්ටි මීටර් 2 - 3 ක් පමණ පහළට පලන්න. පසුව කූඤ්ඤයක් ආකාරයට සකස් කරගත් අනුජය රූපයේ දැක්වෙන පරිදි පැල්මට සවිකරන්න. මෙසේ සවිකිරීමේදී අනුජ රිකිල්ල ග්‍රාහකයට වඩා මහතින් අඩු නම් අනුජය ග්‍රාහකයේ එක් පසෙකට වන සේ තබා ගත යුතුය.



අනුජය ග්‍රාහකයේ පැල්මට ඇතුල් කිරීම

අනතුරුව බද්ධ පටිවලින් හොඳින් වෙලන්න. බද්ධ පටි සඳහා පොලිසැක් බෑග්වල පටි ද යොදාගත හැක.



බද්ධ පටි වලින් වෙලීම



බද්ධ පටි වලින් වෙලීම

බද්ධ කළ පසු පැළයට ආධාරක කෝටුවක් සිටුවා විනිවිද පෙනෙන පොලිතින් කවරයකින් පැළය ආවරණය කර සෙවන සහිත සිසිල් ස්ථානයක තබන්න (Single Propargator).



බද්ධ පැළය විනිවිද පෙනෙන පොලිතින් කවරයකින් ආවරණය කිරීම

දින 21 - 30 කට පසු පොලිතින් කවරය ඉවත් කර සෙවන සහිත දැල් ගෘහයක තබන්න. පැළ විවෘත කර මල් බාල්දියක් වැනි උපකරණයකින් ජලය යෙදීම වැදගත් වේ. මෙලෙස කුඤ්ඤ බද්ධය මගින් 90% ක සාර්ථකත්වයක් ලබාගත හැකිය. පසුව මෙම සාර්ථක වූ බද්ධ පැළ දැඩි කර ගැනීම සඳහා මාසයකට පමණ පසුව දින 10 ක් තුළ වරින් වර ආලෝකයට නිරාවරණය කරන්න. මෙවැනි බද්ධ පැළයක් බද්ධය සිදුකර මාස 4 - 6 කාලයක් තුළදී කෙෂ්ත්‍රයේ සිටුවීමට යොදා ගත හැකිය.



සෙවන ගෘහයේ ඇති බද්ධ පැළ වලට ක්‍රමානුකූලව ආලෝකය වැඩි කිරීමෙන් පැළ දැඩි කිරීම



සාර්ථක බද්ධ පැළයක්

## මේරූ බද්ධ පැළයක් ලබා ගැනීම

බද්ධ කළ පැළ වැඩි කාලයක් (මාස 8 - 10) පොලිතීන් බඳුන් තුළම තබා ගෙන ක්ෂේත්‍රයේ සිටුවීම වඩාත් සුදුසුය. පැළ විශාල කර ක්ෂේත්‍රයේ සිටුවන්නේ නම් බඳුන් මිශ්‍රණයෙන් පුරවා ගත් විශාල ප්‍රමාණයේ පොලිතින් බෑග් වලට මාරු කර තබා ගැනීමෙන් පැළ බාල වීමකට ලක් නොවී තබා ගත හැක. එමෙන්ම ක්ෂේත්‍රයේදී මිය යන බද්ධ පැළ ප්‍රමාණය ද අඩු කර ගත හැකිය.

## නැවත බද්ධ කිරීම

අසාර්ථක වූ ග්‍රාහක පැළයක මහත කොටසින් කපා නැවතත් පෙර පියවරයන් අනුගමනය කරමින් කූඤ්ඤ බද්ධය සිදු කළ හැකිය.

## භූමිය තෝරා ගැනීම හා සකස් කිරීම

දූරියන් වගා කිරීම සඳහා භූමිය තෝරා ගැනීමේදී හොඳින් සූර්යාලෝකය ලැබෙන, ජලවහනය හොඳින් සිදුවන, භූගත ජල මට්ටම අඩි 5 - 6 කට වඩා පහතින් ඇති ගැඹුරු පසක් සහිත භූමියක් තේරීම වඩා සුදුසුය. ප්‍රධාන වශයෙන් එම ප්‍රදේශයෙහි දේශගුණික රටාවන් පිළිබඳ සැලකිලිමත් විය යුතුය. දූරියන් බෝගය පසෙහි තෙතමනයට සංවේදීතාවයක් දක්වන අතර සුදුසු ජලවහන ක්‍රමයක් සැකසීමෙන් සාර්ථක වර්ධනයක් ලබා ගත හැකිය. දල බෑවුම් භූමිවල පාංශු ඛාදනය වැලැක්වීම සඳහා කොන්ටුවර් (සමෝච්ඡ රේඛා ඔස්සේ) හෝ හෙල්මලු ලෙස වගා කිරීම සුදුසු වේ. විශේෂයෙන් වර්ධනය වන මුල් අවධියේදී පාංශු සංරක්ෂණය සඳහා ආවරණ වගා යෙදීම සුදුසුයි. බෑවුම් භූමි වලදී මතුපිට පාංශු ඛාදනය වැලැක්වීම සඳහාත් මූල පද්ධතියට අවශ්‍ය ජලය ලබාගැනීම සඳහාත් ඉංග්‍රීසි "ඞී" අක්ෂරයෙහි හෙල්මලු සකස් කළ යුතුය.(පසු බෑවුම්වූ ඒකීය බිම් තට්ටු ආකාරයට)

ප්‍රශස්ත වර්ෂාපතනයක් නොමැති ප්‍රදේශ සඳහා ජල පහසුකම් සම්පාදනය කළ යුතුය. පැළ සිටුවීමට මාස කීපයකට පෙර තෝරාගත් භූමියෙහි අනවශ්‍ය ගල්, මුල්, වල් පැළෑටි ඉවත් කර කැට පොඩිකර පස අවශ්‍ය තත්ත්වයට සකස් කර ගත යුතුය. පැරණි වගා වල මුල් ඉවත් කිරීම ඉතා වැදගත්ය. වගා කිරීමේදී මෑතකදී රබර් වැනි බෝගයක් වගා නොකළ බිමක් යොදා ගන්නේ නම් වඩාත් සුදුසු වේ. දූරියන් බෝගය සඳහා හොඳ ආලෝක තත්ත්වයක් අවශ්‍ය වේ. උපරිම ආලෝකයක් ලැබෙනසේ උතුරු දකුණු දිශානතව පේළියට පැළ සිටුවීම කළ යුතුය. චතුරශ්‍ර ක්‍රමයට පැළ සිටුවීම ජනප්‍රිය ක්‍රමයකි.

## පරතරය

පැළ අතර මීටර් 10 ක් හෝ 12 ක් පරතරය වූ විට හෙක්ටයාරයකට පැළ 100 -70 ක් පමණ පැළ ධාරිතාවක් තිබේ.

## පැළ සිටුවීම

දූරියන් ස්වපරාගණය සඳහා ඉතා අඩු නැඹුරුතාවක් පෙන්වන බැවින් වාණිජ වගාවක් සඳහා නිර්දේශිත වර්ග කිහිපයක් මිශ්‍රව වගා කිරීම සුදුසු වේ. එසේම එම පැළ වගා බිමේ ස්ථාපනය කරන විට මාරුවෙන් මාරුවට හැකි පමණ මිශ්‍රවන අයුරු සිටුවීම වඩා ඵලදායී වේ.

මීටර් 1 x මීටර් 1 x මීටර් 1 ප්‍රමාණයේ වලවල් පැළ සිටුවීමට සති 4 කට පෙර වර්ෂාව ආරම්භ වීමත් සමඟම සැකසිය යුතුය. නිසරු බිම් සඳහා වලක් හැකි පමණ විශාල ලෙස සකස් විය යුතුය. පස් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව පසෙහි pH අගය අනුව ආම්ලික පසක් නම් ඩොලමයිට් ග්‍රෑම් 500 ක් එක් වළකට යෙදිය යුතුය. ඉහත ප්‍රමාණයට අනුව සකසන ලද වළවල් පහත දක්වා ඇති අන්දමට කාබනික පොහොර සහ මතුපිට පස් වලින් පිරවිය යුතුය. පසුව සාමාන්‍යයෙන් හොඳින් දිරූ කාබනික පොහොර කොටස් 1 කට මතුපිට පස් 1 ක් වන අනුපාතයට මිශ්‍ර කර වල පුරවන්න. පිරවීමේදී පස් මුදුන් වන ආකාරයට පුරවන්න. වළේ මැදට පස් මුදුන සිටින ලෙස වල පුරවා කෘෂ්ණදයකින් සලකුණු කර සති 2-3 පමණ කාලයක් තබන්න. පැළ සිටුවීමට දින 2 - 3 කට පෙර නිර්දේශිත මූලික රසායන පොහොර මිශ්‍රණය යොදන්න.

අධික වර්ෂාවක් ඇති විට පැළ සිටුවීම නොකළ යුතුය. තවද දැඩි කරන ලද පැළ ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා යොදා ගත යුතුය. මූල මණ්ඩලයට හානි නොවන සේ තවානෙහි සිට සිටුවීම සඳහා ප්‍රවේශමෙන් පැළ ප්‍රවාහනය කළ යුතුය. පැළය සහිත පොලිතින් බෑගය දෙපැත්තෙන් පහළට කපා සකස් කරගත් වලවල් තුළ ප්‍රවේශමෙන් සිටුවිය යුතුය. සකස් කර ගත් වළෙහි මධ්‍යයෙහි පැළයේ ප්‍රමාණයට සරිලන කුඩා වළක් සකසා එහි පැළය තබා එහි මූල මණ්ඩලයට හානියක් නොවන සේ පස් මිශ්‍රණයෙන් පුරවමින් සිටුවිය යුතුය. බඳුන් පැළ ස්ථාපනය කිරීමේදී මුල් වලට හානිවීම, පැළ ස්ථාපනය අසාර්ථක වීමට එක් හේතුවකි. මූල මණ්ඩලය පස සමඟ සම්බන්ධ වීම සඳහා ඇඟිලි වලින් පස තද කළ යුතුය. පැළ සිටුවූ පසු පැළය පාමුල ජලය එකතු නොවන ආකාරයට පස් සකස් කිරීම ඉතා වැදගත් වේ.

සිටුවන ලද පැළ ඍජුව වර්ධනය කර ගැනීමට සහ නඩත්තු කටයුතු වලදී හානිවීම වැලැක්වීම සඳහා මීටර් 1.5 ක් පමණ උසැති ආධාරකයක් පැළය ආසන්නයේ ඍජුව සිටුවා පැළය එම ආධාරකයට හේත්තු කර කෙලින් වන සේ කිහිප පොලකින් බඳින්න. පැළය වර්ධනය වීමත් සමඟ බැඳීම ඉහළින් සිදු කරන්න. පැළ සිටවූ වහාම ජලය සැපයීම අත්‍යවශ්‍ය වේ. වියළි කාලගුණ තත්ත්වයක දී නම් පැළ සිටවූ මුල් මාසය තුළ හොඳින් ජලය සැපයිය යුතුය. ලපටි මුල් සඳහා පසෙහි තෙතමනය අවශ්‍ය වේ. වියළි ස්වභාවයක් පැළයට ඇති නොවන අයුරින් ජල සම්පාදනය කිරීම වැදගත් වේ.

දූරියන් මුල් ඉතා පහසුවෙන් ෆයිටොෆ්තොරා දිලීර රෝගයට පාත්‍රවන බැවින් වැඩිපුර ජලය රඳා පැවතීම ද සුදුසු නොවේ. තවද නොදිරූ කාබනික පොහොර යෙදීම, වල් ඉවත් කිරීමේදී මුල් වලට තුවාල වීම වැනි කරුණු නිසා ද මුල් කුණුවීමේ දිලීර රෝගයට පැළ පාත්‍ර වීම සිදුවේ. මේ නිසා පැළ වටේ උපකරණ භාවිතා කර වල් නෙළීම සිදු නොකළ යුතුයි. පැළ සිටුවන අවස්ථාවේ අක්‍රමවත් වර්ෂාවක් පවතී නම් පසෙහි තෙතමනය රැකගැනීම සඳහා පැළ පාදය ආසන්නයේ පිදුරු හෝ කාබනික පොහොර හෝ වසුනක් යෙදීම කළ යුතුය.

පැළය සිටුවූ වහාම සෙවන සැපයිය යුතු අතර පළමු වසර තුල 70% ක සෙවනක් ලබා දීම වඩාත් යෝග්‍යය වේ. එමඟින් පැළයේ වර්ධන වේගය වැඩි කර ගත හැකිය. සෙවන සැපයීමට වෙළඳපොලෙන් ලබා ගන්නා සෙවන දැල් භාවිතා කළ හැකි අතර මේ සඳහා පැළය මැදිවන සේ අඩි 4 ක් පමණ උසට මැස්සක් සකස් කර සෙවන දැල නැගෙනහිර බටහිර දිශාවට යෙදීම සුදුසුය.

පැළය වර්ධනය වන විට පරීක්‍ෂා කර බලා ග්‍රාහකයෙන් ඇතිවන අංකුර ඉවත් කරන්න. පැළය තනිව වැඩෙන අවස්ථාව පෙන්වන තෙක් ආධාරකය සහ සෙවන පවත්වා ගන්න.

## පොහොර යෙදීම

දූරියන් වලින් ඉහළ ගුණාත්මක හා වැඩි අස්වනු ලබා ගැනීමට කාබනික පොහොර සමඟ රසායනික පොහොර නිර්දේශිත ප්‍රමාණ වලින් යෙදිය යුතුය. පැළ සිටුවීමට සති 02 කට පෙර කාබනික පොහොර, වලකට කිලෝ ග්‍රෑම් 10 ක් වන සේ එකතු කර මතුපිට පස් සමඟ මිශ්‍ර කර වළවල් පුරවා ගත යුතුය. පසේ pH අගය 4.5 ට අඩු නම් පැළ සිටුවීමට සති 02 කට පෙර වලකට ඩොලමයිට් ග්‍රෑම් 500 ක් එකතු කර හොඳින් කලවම් කර ගත යුතුය. ඉන්පසු හැකි සෑම අවස්ථාවකදීම හොඳින් දිරාපත් වූ ගොම හෝ කොම්පෝස්ට් වැනි කාබනික පොහොර දූරියන් පැළ වටා විසුරුවා මුල්ලු කර ගත යුතුය. එලෙසම පැළ සිටුවීමට දින 02 කට පෙර නිර්දේශිත මූලික පොහොර මිශ්‍රණය වළවල් වලට දමා කලවම් කර ගත යුතුය. මතුපිට පොහොර යෙදීමේදී ගසේ පාමුල සිට සෙන්ටි මීටර් 40 - 45 පමණ දුරකින් අරඹා ගසේ වර්ධනයත් සමඟ අතු විහිදී ඇති සීමාව දක්වා ගස වටා පොහොර විසුරුවා හැර පස සමඟ හොඳින් මිශ්‍ර කළ යුතුය.

ඵල දැරීම ආරම්භ වූ පසු පොහොර ප්‍රමාණය අවුරුද්දක් තුල අවස්ථා දෙකකදී යෙදීම සුදුසුයි. පළමු කොටස මල් හට ගන්නා අවස්ථාවේදී හා දෙවන කොටස ඵල නෙලූ පසු සිදුකරන කප්පාදුව අවසානයේදී යොදන්න. කාබනික පොහොර වාර්ෂිකව පැළයකට කි.ග්‍රෑ. 10 පමණ යෙදීම වැදගත්ය. පසේ pH අගය අඩුනම් ඩොලමයිට් 500 පමණ ගසකට යෙදීම අවශ්‍යය. ඩොලමයිට් සහ කාබනික පොහොර පැළය විශාල වීමත් සමඟ වැඩි කළ යුතුය.

පොහොර යෙදීමේදී එම ප්‍රමාණය වැඩිපුර වාර ගණනකදී යෙදිය හැකි නම් වඩාත් කාර්යක්ෂමවේ.

# පොහොර යෙදීම

## නිර්දේශිත පොහොර ප්‍රමාණය

| ශාකයේ වයස | යොදන අවස්ථාව | පොහොර ප්‍රමාණය (ශාකයකට ග්‍රෑම්) | | | |
|---|---|---|---|---|---|
| | | යූරියා | TSP/ROP | MOP | කිසරයිට් |
| සිටුවීමට පෙර | මුලික පොහොර | 40 | 60 / 100 | 30 | - |
| පළමු වසර | සෑම මාස 4 කට වරක් | 40 | 60 / 100 | 30 | 20 |
| දෙවන වසර | සෑම මාස 4 කට වරක් | 80 | 120 / 200 | 60 | - |
| තෙවන වසර | සෑම මාස 4 කට වරක් | 160 | 180 / 300 | 120 | 40 |
| හතරවන වසර | සෑම මාස 4 කට වරක් | 240 | 240 / 400 | 180 | - |
| පස්වන වසර සිට ඵල දරන තුරු | සෑම මාස 4 කට වරක් | 320 | 300 / 500 | 240 | 80 |
| ඵල දරන ශාකවලට පළමු වසර සහ දෙවන වසර | අස්වනු නෙළූ පසු<br>මල් පිපුණු පසු | 750<br>250 | 485 / 800<br>485 / 800 | 500<br>500 | 100<br>- |
| තෙවන වසර සිට පස්වන වසර දක්වා | අස්වනු නෙළූ පසු<br>මල් පිපුණු පසු | 900<br>300 | 610 / 1000<br>610 / 1000 | 650<br>650 | 150<br>- |
| හයවන වසර සිට දහවන වසර දක්වා | අස්වනු නෙළූ පසු<br>මල් පිපුණු පසු | 1050<br>350 | 730 / 1200<br>730 / 1200 | 800<br>800 | 200<br>- |
| එකොලොස්වන වසර සිට ඉන් පසුවට | අස්වනු නෙළූ පසු<br>මල් පිපුණු පසු | 1200<br>400 | 850 / 1400<br>850 / 1400 | 950<br>950 | 250<br>- |

TSP - ට්‍රිපල් සුපර් පොස්පේට් MOP - මියුරේට් ඔෆ් පොටෑෂ් ROP - රොක් පොස්පේට්

## ශාකය පුහුණු කිරීම, කප්පාදුව හා නඩත්තුව

ශාකය මනා උසකින් හා හොඳ ව්‍යුහයකින් පවත්වා ගැනීමට, ඉහළ අස්වැන්නක් සහිතව රෝග පලිබෝධ වලින් තොර සාරවත් ඵලදාවක් ලබා ගැනීමට, පශ්චාත් අස්වනු හානිය අවම කර ගැනීමට හා ඵල නෙලීමේ පහසුව සඳහා දූරියන් ශාකය කප්පාදු කිරීම අවශ්‍යය. ගසක් කප්පාදු කිරීම ගෙවතු වගාවක් ද වාණිජ වගාවක් ද යන්න මත ආකාර දෙකකි. වර්තමානය වන විට දූරියන් ගසක් අවශ්‍යතාවය අනුව ගෙමිදුලේ පවත්වා ගන්නා තරමට කුඩාවට සකස් කර ගත හැකිය.

## ගෙවතු වගාවකදී

ගෙවතු වගාවකදී දූරියන් ගස කුඩාවට සකස් කර ගත යුතුවේ. මෙහිදී ගස කුඩා අවස්ථාවේදීම එහි අග්‍රස්ථය ඉවත් කරගත යුතුය. මෙය ඉවත් කිරීම නියපොත්තෙන් කැඩිය හැකි තරම් ළපටි අවධියේදී සිදු කිරීම වඩාත් යෝග්‍ය වේ. මෙවිට පාර්ශවික අතු ඇතිවීම සිදුවේ. මුලින් ඇතිවන පාර්ශවික අතු 3 ක් පමණ ආධාරක කෝටු සිටුවා සිරස්ව වැඩීමට යොමු කරන්න. මෙසේ වන අතරතුර නැවත නැවත අග්‍රස්ථය ඉවත් කරන්න. තවද ගස තිරස්ව වැඩී වර්ධනයක් පෙන්වන අතර උස අවශ්‍ය ආකාරයට වරින්වර අග්‍රස්ථය ඉවත් කරමින් පාලනය කර ගත යුතුයි. වාණිජ වගාවකට සාපේක්ෂව මෙහි අස්වැන්න අඩුය. කුඩා ගෙවත්තක වුවත් දූරියන් ගසක් මේ ආකාරයට සකස් කර ගත හැකිය.

## වාණිජ වගාවකදී

පැළය ක්ෂේත්‍රයේ මනාව ස්ථාපනය වී ගසේ උස මීටර් 1.5 ක් පමණ වන විට කප්පාදුව ඇරඹිය යුතුය. මුල් අවදියේ දී බද්ධ පැළයේ ග්‍රාහකයෙන් අංකුර ඇතිවන අතර ඒවා ඉවත් කරන්න. මේවා අනුජයෙන් ඇතිවන අංකුර වලට වඩා වේගයෙන් වර්ධනය වන බැවින් නිරතුරුව සුපරීක්ෂාවෙන් සිටීම අවශ්‍යය. නැතහොත් ග්‍රාහක පැළයක් වර්ධනය වී බද්ධ අංකුරය මිය යනු ඇත. මුලදී තනි ප්‍රධාන කඳක් ලෙස පවත්වා ගැනීම අවශ්‍ය බැවින් පොළවට ඉතාම ආසන්නයේ එන අතු පමණක් ඉවත් කරන්න. තිරස් අතු ඉවත් කිරීම හැකි පමණ අවම ලෙස සිදුකරන්න. ශාකය තුළට හොඳින් ආලෝකය ලැබීම සඳහා ඉතා ලංව (30cm වඩා) පිහිටි අතු සහ අතිරික්ත අතු, දුර්වල අතු, දිය රිකිලි, රෝග පලිබෝධ මඟින් හානි වූ අතු ඉවත් කළ යුතුය.



**පොළවට ආසන්නයේ එන අතු ඉවත් කිරීම**

ශාකයේ උස වැඩි වීමත් සමඟ වාණිජ වගාවක මීටර් 8 - 10 උසකින් ගස පවත්වා ගැනීමට අග්‍රස්ථය ඉවත් කළ යුතු වේ. මෙවිට පාර්ශවික අතු වර්ධනය වඩාත් සාර්ථක වේ. සැමවිටම දූරියන් ගස උස්ව වැඩීමට නැඹුරුවක් දක්වන බැවින් මෙම උස පවත්වා ගැනීම දිගින් දිගටම කළ යුතු වේ.



**මුදුන් කප්පාදුව සිදු කිරීම**

අතු කැපූ පසු කැපුම් තලවල කණ්ඩසාන් වැනි දිලීර නාශකයක් සහිත ගල්වනයකින් ආලේප කිරීම ඉතා වැදගත්ය.



**අනවශ්‍ය අතු ඉවත් කිරීමෙන් පසු කැන්ඩසාන් ආලේප කිරීම**

ඵල හටගන්නා ශාකවල සාර්ථක ඵලදාවක් ලබා ගැනීමට නම් ශාකය තුළට හොඳින් ආලෝකය ලැබිය යුතුය. මේ සඳහා සෑම වසරකම කප්පාදු කළ යුතුය. සාමාන්‍යයෙන් දූරියන් ශාකයක් වසරකට දෙවතාවක් කප්පාදු කිරීම සිදු කරයි.

පළමු කප්පාදුව අස්වැන්න ලබා ගත් පසු සැප්තැම්බර් - ඔක්තෝබර් යන මාසවලදී පමණ සිදු කරනු ලබයි. එහිදී රෝග හා පලිබෝධ හානි සහිත අතු ද, නිසරු හා මැරුණු අතු ද, දිය රිකිලි ආදිය ද ඉවත් කළ යුතුය.



**අනවශ්‍ය හා මැරුණු අතු ඉවත් කිරීම**

එමෙන්ම ගස අභ්‍යන්තරයේ ප්‍රධාන අතු වල හටගන්නා කුඩා රිකිලි ඉවත් කිරීම ඉතා වැදගත් වේ. එමගින් මල් අස්වැන්න තීරණය වේ. මෙහිදී වැදගත් වනුයේ රිකිළි ඉවත් කිරීමේදී ප්‍රධාන කඳට රිකිලි සම්බන්ධ වන ස්ථානයේ ඇති කුඩා ගැටය ගසෙන් නොගැලවෙන සේ ඉවත් කිරීමය. කතුරක් හෝ සෙකටියරයක් භාවිතා කොට අතු ඉවත් කිරීම වඩා සුදුසුයි.

ආලෝකය හොඳින් නොවැටෙන සේ ලංව පිහිටි අතු ද ඉවත් කරන්න (සාමාන්‍ය-යෙන් අතු දෙකක් අතර පරතරය සෙන්ටි මීටර් 40 - 50 ක් පමණවත් තිබිය යුතුය). විශාල අතු කැපීමේදී ඒවා ආනතව කැපිය යුතු අතර ගස දිරායාම වැලැක්වීම සඳහා කැපුම් මුහුණතේ කණ්ඩසාන් වැනි දෙයක් ආලේප කළ යුතුය. මෙම කප්පාදුව අවසා-නයේ නිර්දේශිත පොහොර යෙදීමෙන් ශාකය වර්ධනය වීමට සැලැස්විය යුතුය.

දෙවන කප්පාදුව පළමු කප්පාදුව සිදු කර මාස 1 - 2 ක් පමණ පසුව එනම් නොවැම්බර් හෝ දෙසැම්බර් මාස වල දී පමණ සිදු කරනු ලැබේ. එහිදී ද ගස ආසන්නයේ වර්ධනය වෙමින් පවතින රිකිලි සියල්ලක්ම ඉවත් කර ගත යුතුය.

ගස් අභ්‍යන්තරයේ රිකිලි ඉවත් කිරීමේදී ගසේ වයස වැඩිවත්ම ගසේ ප්‍රමාණය විශාල වත්ම අතු ඉවත් කිරීම ක්‍රමයෙන් වියනෙහි පිටත දක්වා වැඩි කරන්න. තවද උස නිශ්චිතව පවත්වා ගැනීම සඳහා මුදුන් කප්පාදුව වරින් වර සිදු කළ යුතු වේ.



**කප්පාදුව හොඳින් සිදු කරගෙන යන දූරියන් ශාකයක්**

## පුෂ්ප පරාගණය

දූරියන් ගසක අධික මල් සංඛ්‍යාවක් හට ගත්ත ද සාපේක්ෂව ඵල හට ගන්නේ සුළු වශයෙනි. මල් නිසි ලෙස පරාගණය නොවීම මීට හේතු වේ. දූරියන් මල් පොකුරු වශයෙන් පාර්ශ්වික අතුවල හටගනී. එක පොකුරක සාමාන්‍යයෙන් මල් 25 ක් පමණ හටගන්නා අතර උපරිම වශයෙන් මල් 75 ක් පමණ පවතින අවස්ථා ද ඇත. පුෂ්පයක් ගසේ හටගන්නා අවස්ථාවේ සිට විවෘත වීම දක්වා කාලය දවස් 40 - 50 පමණ වේ.

මෙම ශාකයේ පුෂ්පවල ස්වපරාගණය ඉතාමත් සුළු වශයෙන් සිදුවන බව පැහැදිලි වේ. ස්වපරාගණය සිදුවීම 0 - 10% වන අතර ඒවා ප්‍රභේද අනුව සුළු වශයෙන් වෙනස්කම් දක්වයි. එබැවින් මෙම බෝගයේ ඵල ඇති වීමට නම් පරපරාගණය සිදුවීම එනම් වෙනත් ප්‍රභේදයකින් පරාග පැමිණීම සිදුවිය යුතුය. මෙයට ප්‍රධාන හේතුව වන්නේ කලංකයේ ග්‍රාහී බව පරාග මේරීමට බොහෝ වේලාවකට පෙර සිදුවීමයි. කලංකයේ ග්‍රාහී බව ආරම්භ වනුයේ සවස 2.00 - 4.00 ට පමණය. මෙම ග්‍රාහී බව එදිනම රාත්‍රී 10.00 පමණ වන තෙක් තිබෙන නමුත් උපරිම ඵලදායි අවස්ථාව වශයෙන් පෙන්නුම් කරනුයේ රාත්‍රී 7.00 සිට 9.00 පමණ වන තෙක්ය. දූරියන් මල සම්පූර්ණයෙන් විවෘත වන්නේ සවස 3.00 - 4.00 ට පමණය. ඇතැම් ප්‍රභේද වල කලංකය මල් පොහොට්ටු අවස්ථාවේදීම පිටතට පෙනෙන පරිදි එලියට නෙරා විත් පවතියි. මෙම හැසිරීම පුෂ්ප වල පරපරාගණයට නැඹුරු වීමක් ලෙස දැක්විය හැකිය. එසේම දූරියන් ගසක මල් රාශියක් හටගන්නා අතර එය ද පරපරාගණය සඳහා ශාකයේ සැකසීමක් වේ.

පරාගධානි පුපුරා පරාග පිටවීමට පටන් ගන්නේ සවස 6.00 න් පසුවය. මෙම කාලය දිනයේ කාලගුණික තත්ත්වය මත වෙනස් වේ. එබැවින් ස්වාභාවික ලෙස පරපරාගණය වීමට නම් පරාග පිපිරීමෙන් පසුව එනම් සවස 6.30 න් පමණ පසුව වෙනත් ප්‍රභේදයක මලක පරාග වලින් පරාගනය සිදුවිය යුතුය.


ස්වාභාවික තත්ත්ව යටතේ මේවා පරාගණය කරනු ලබන්නේ වවුලන් හා රාත්‍රියේ සැරිසරන කෘමීන්ගෙනි. කෘත්‍රිමව අතින් පරාගණය සිදුකරනු ලබන්නේ නම් පරාගධානි පිපරීමෙන් පසු රාත්‍රී 7.00ට පමණ පරාගණය සිදුකිරීමෙන් ඉතා ඉහළ අස්වැන්නක් ලබා ගත හැක. තවද නිසි ලෙස පරාගණය වූ විට පුහු සහ අක්‍රමවත් ගෙඩි හට ගැනීම අවම වේ.

## කෘතිම පරාගණය

කෘතිම පරාගණය කිරීම සඳහා අඩු වශයෙන් ප්‍රභේද 2 ක් වත් තිබිය යුතුය. එක ප්‍රභේදයක පුෂ්පවල පරාග අනික් ප්‍රභේදයේ පුෂ්ප වල කලංකය මත තැවරීමෙන් මෙම පරපරාගණය සිදුකළ හැකිය. කලංකය ප්‍රධාන කන්ඩිකා 5 කට බෙදී ඇති බැවින් සම්පූර්ණයෙන් එම කොටසේ පරාග තැවරෙන ආකාරයට පරාගනය කිරීම, පිරිපුන් ඵලයක් ලබාගැනීමට ඉතා වැදගත් වේ. පරාග තැවරීම සඳහා සම්පූර්ණ පුෂ්පයම පාවිච්චි කිරීමට හෝ පරාගධානි ඉවත් කොට එහි ඇති පරාග ද පාවිච්චි කළ හැක.



වෙනත් වර්ගයක පුෂ්පයකින් පරාග තැවරීම



පරාග එකතු කර ගැනීම

පරාගණය වූවත් නොවූවත් මලෙහි ඩිම්බ කෝෂය හා කීලය හැර අනෙකුත් කොටස් දිනක් ඇතුලත හැලී යයි.



**ඩිම්බකෝෂය හා කීලය පමණක් ඉතිරි වූ පුෂ්ප**

පරාග තැවරීමෙන් පසු ගෙඩි හට ගැනීම දවස් 5 -7 න් පමණ පසු අපට බලාගත හැකි වනුයේ පුෂ්පයේ ඩිම්බ කෝෂය කොළ පැහැයට හැරී මහත් වීමෙනි. ඵලය හට ගෙන ගෙඩිය හොඳින් මෝරා ඉදීමට ආසන්න තත්ත්වයට පත් වීමට එනම් නෙලා ගැනීමට සුදුසු තත්ත්වයට පත් වීමට දවස් 75 - 120 ක් පමණ ගතවේ. මෙම කාලය ප්‍රභේද අනුව සුළු වශයෙන් වෙනස් විය හැකිය.

## කෘතිම මල් උත්තේජනය කිරීම

දූරියන් ගසක් නිසි වයසේ දී මල් හටගැනීමක් සිදු නොවන්නේ නම් හෝ ප්‍රමාණවත් මල් ප්‍රමාණයක් හට නොගන්නේ නම් හෝ අවාරයේ ඵල ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් රසායනික ද්‍රව්‍ය මඟින් මල් හටගැනීම උත්තේජනය කළ හැක. මේ සඳහා පැක්ලබියුට්‍රසෝල් නම් රසායනික ද්‍රව්‍ය භාවිතා කිරීම සිදුකරනු ලබයි. මේ සඳහා ගස ප්‍රමාණවත් පරිදි විශාල විය යුතුයි. ගසේ වියන පැතිරී ඇති වැඩිම විෂ්කම්භය ගෙන එහි එක් මීටරයකට ක්‍රියාකාරී සංයෝගයෙන් ග්‍රෑම් 1 - 1.5 වන පරිදි ගසේ විෂ්කම්භය අනුව අවශ්‍ය ක්‍රියාකාරී සංයෝගය ගණනය කර එම කුඩු ප්‍රමාණය ජලයේ දිය කර ද්‍රාවණයක් සාදා ගනු ලබයි. පසුව ගස වටා මීටර් 1 - 1 1/2 පමණ ඈතින් නියරක් ලෙස සකසා නියර ඇතුළත ප්‍රදේශයත් ගසේ පහත කොටසත් හොඳින් තෙමෙන ලෙස සාදා ගත් ද්‍රාවණය යොදන්න. මෙම ප්‍රතිකාරය සිදුකර මල් හට ගැනීමට දින 45 සිට මාස 3 ක් දක්වා කාලයක් ගතවේ. ද්‍රාවණය යෙදූ පසු ගසට තෙතමනය ලබා දීම අඛණ්ඩව මාස 3 ක් පමණ කළ යුතුයි. තද වැසි කාලයේ යෙදීම සුදුසු නොවේ.

මෙම රසායන ද්‍රව්‍ය සාන්ද්‍රණය සඳහා විවිධ ප්‍රභේද දක්වන ප්‍රතිචාර වෙනස් විය හැක. සාන්ද්‍රණය වැඩි වුවහොත් ගස්වල පත්‍ර අතර දුර (පර්ව දුර) කෙටි වී පත්‍ර ගොනු වන ආකාරයක් දැකිය හැකිය. මේ නිසා ගසකට යොදන පැක්ලබියුට්‍රසෝල් ප්‍රමාණය ගණනය කර ගැනීම නිවැරදිව කළ යුතුය.

# රෝග හා පළිබෝධ පාලනය

## ෆයිටොෆ්තොරා දිලීරය මගින් ඇතිවන රෝග

ෆයිටොෆ්තොරා පාම්වොරා (*Phytiphthora palmivora*) නම් දිලීරයෙන් ඇතිවන මෙම රෝග දූරියන් ශාකයට ඉතා හානිකර ලෙස සැළකේ. ශාකයේ විවිධ වර්ධක අවස්ථාවලට ද, විවිධ කොටස්වලට ද මෙමගින් හානි පැමිණේ. පැච් කැන්කර් (Patch Canker) නම් කඳට ඇතිවන ආසාදනයක් ද මුල් කුණු වීම ද, පත්‍ර වලට අංගමාරය වැනි තත්වයක් ද, කුඩා

පැළ අග සිට මිය යාමද ඉහත දිලීරය මඟින් ඇති කරන රෝගී තත්ත්වයන්ය. ගෙඩිවලට ද මෙම දිලීරය හානි කරයි. බීජ පැළ අවස්ථාවේ මෙම දිලීරය හානි කළහොත් මුළු බීජ පැළ ප්‍රමාණයෙන් 50% දක්වා ප්‍රමාණයක් විනාශ වීමේ ඉඩකඩ ඇත.


මීට අමතරව මෙම දිලීරය මගින් කොළ වලට පත්‍ර අංගමාරය වැනි තත්ත්වයක් ඇති කරයි. නමුත් මෙය එතරම් හානිකර තත්ත්වයක් නොවේ.

## පැච් කැන්කර්

මෙම රෝගය ආරම්භ වන්නේ කඳේ තැන තැන දිය ගැල්වුණු ලප ඇති වීමෙනි. අනතුරුව මේවා පිළිස්සුණු ස්වභාවයකට පත්වන අතර ඒවායින් රතු දුඹුරු පැහැති ඇලෙන සුළු ද්‍රව්‍යයක් පිටතට පැමිණේ. කඳේ තැන තැන පොතු ගැලවී යාම, පත්‍ර වියළී අතු අග සිට මැරී යාම වැනි ලක්ෂණ ද ඇතිවේ. රෝගය දරුණු වුවහොත් පත්‍ර හැලී ගස මියයාම සිදුවේ. මෙම රෝගය පවතින රටවල එය මර්ධනය සඳහා ප්‍රධාන කඳේ සහ අතු වල රෙඩ් ලයිම් (Red Lime) හෝ මෙටලැක්සිල් (Metalaxyl) ආලේප කිරීම සිදුකරයි. පොස්ෆොනේට් කඳට විදීම (16g AI./ tree) මඟින් පැච් කැන්කර් රෝගය මර්ධනය කිරීම මෙටලැක්සිල් ආලේප කිරීමට වඩා සාර්ථක බව වාර්තා වේ.

## ෆයිටොෆ්තොරා ගෙඩි කුණුවීම

මෙහිදී ඵලය මත පළමුව කුඩා දිය ගැල්වුණු පැල්ලම් ඇතිවේ. ඒවා දුඹුරු පැහැති වී ඉදෙන විට ක්‍රමයෙන් විශාල වේ. මෙය පසු අස්වනු රෝගයක් ලෙස සැලකුවත් ඇතැම් විට ගසේදී නොමේරූ ඵල වලටද ඇති විය හැකිය. මේවා ආහාරයට ගන්නා කොටසට ද අනතුරුව බීජයට ද පැතිරෙයි. ඉතා සුළු කාලයකින් සම්පූර්ණ ඵලයම කුණු වීමට හැකිය. මෙම රෝගය වර්ෂා කාලයේ ඉතා තදින් ව්‍යාප්ත වේ.



**රෝග ලක්ෂණ පෙන්වීම**

ගෙඩි කුණුවීම වැළැක්වීම සඳහා සනීපාරක්ෂක ක්‍රම, ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම හා රසායනික ක්‍රම සමෝදානාත්මක ලෙස මුල සිටම අනුගමනය කිරීමෙන් මර්ධනය කර ගත හැක.

## ෆෝමොප්සිස් පත්‍ර පුල්ලි රෝගය/ ගෙඩි කුණු වීමේ රෝගය

ෆෝමොප්සිස් ඩුරියෝනිස් (*Phomopsis durionis*) නම් දිලීරය මගින් මෙම රෝග ඇති කරනු ලැබේ. බීජ පැළ, පත්‍ර පුල්ලි රෝගයට ඉතා පහසුවෙන් ගොදුරු වන අතර එහිදී ඒවායේ පත්‍ර සම්පූර්ණයෙන් හැලී යාමට ඉඩ ඇත. පත්‍ර හැලී ගිය ශාක පහසුවෙන් ද්විතියික ආසාදන වලට පාත්‍ර වේ. පත්‍ර හොඳින් වැඩී ඇති විශාල ශාක සඳහා මෙය එතරම් හානිකර රෝගයක් නොවේ. මෙහිදී පත්‍ර මත පිලිස්සුණු ස්වභාවයක් ගන්නා දුඹුරු පැහැති කුඩා ලප ඇති වේ. ඒවා කහ පාට ප්‍රදේශයකින් වට වී පවතියි.



**පත්‍ර මත අණ්ඩාකාර ලප ඇතිවීම**

ක්‍රමයෙන් මෙම පුල්ලි විශාල අණ්ඩාකාර හෝ වටකුරු ලප (විෂ්කම්භය මිලි මීටර් 1) බවට පත්වේ. පත්‍ර උඩු තලයේ අක්‍රමවත්ව විසිරී ඇති මේවා පත්‍ර යටි තලයේ හඳුනා ගැනීම අපහසුය. කල් යන විට මෙම ලප මධ්‍යයේ කළු පැහැති ස්ථාන ඇතිවේ. මේ සඳහා වැඩිදුර අධ්‍යයනය කර නොමැති අතර මර්ධනය සඳහා බිනොමිල්, කාබෙන්ඩසිම් වැනි සංස්ථානික දිලීරනාශක සමඟ මැන්කොසෙබ් ක්ලෝරොතැලොනිල් වැනි ආරක්ෂිත දිලීර නාශක ද යෙදිය හැකිය.

ඵල වලට රෝගය ඇති වූ විට කුඩා, තද දුඹුරු පැහැති, වටකුරු හෝ අණ්ඩාකාර පැල්ලම් ඇතිවේ. මේවා ඉතා වේගයෙන් වර්ධනය වී විශාල වේ. ගෙඩියේ කටුවල අග මිය යයි.

## ෆියුසාරියම් ගෙඩි කුණුවීම

මෙය ඇති වන්නේ ෆියුසාරියම් සොලනි (*Fusarium solani*) නමැති දිලීරයෙනි. මෙහිදී ඵලය මත දුඹුරු පැහැති, මෘදු, දිය ගැල්වුණු ස්වභාවයක් ගන්නා පුල්ලි ඇතිවේ. මෙම පුල්ලි මත සුදු පැහැති දිලීර ජාලය දක්නට ඇත. මෙය එතරම් හානිකර රෝගී තත්ත්වයක් නොවේ.

## පින්ක් රෝගය

එරිත්‍රිසියම් සැල්මොනිකොලර් (*Erythricium salmonicolor*) නම් දිලීරයෙන් ඇතිවන මෙම රෝගය දූරියන් ශාකයට ඉතා හානිකර ලෙස බලපායි. මෙහිදී ශාකයේ කාෂ්ඨීය කොටස් හා කුඩා අතු වියළීම හා අග සිට මැරීයාම සිදුවේ. මෙම රෝගය වැසි අධික, වලාකුළු සහිත තත්ත්ව යටතේ ඇතිවේ. මෙම දිලීර ජාලය රෝස සුදු පැහැතිය. එය ගසේ අතු ආවරණය කරමින් වර්ධනය වේ. මෙසේ දිලීරයෙන් ආවරණය වූ අතු ක්‍රමයෙන් මිය යන අතර දිලීර ජාලය කල් ගත වන විට රෝස පැහැති කබොලක් ලෙස දිස්වේ.

### පාලනය

ගස් අතර පරතරය වැඩි කොට අනවශ්‍ය කොටස් කප්පාදු කිරීමෙන් ගසට මනා වාතාශ්‍රයක් ලැබීමට සැලැස්විය යුතුය. මිය ගිය කොටස් ඉවත් කොට පුළුස්සා දැමිය යුතුය. මීට අමතරව කොපර් අඩංගු දිලීර නාශකයක් යෙදීම මඟින් මෙම රෝගය පාලනය කර ගත හැක.

## රයිසොක්ටෝනියා කොළ අංගමාරය

මෙම රෝගය රයිසොක්ටෝනියා සොලනි (*Rhizoctonia solani*) නම් දිලීරයෙන් ඇතිවේ. දූරියන් සඳහා මෙය සුලභ එසේම හානිකර රෝගයකි. බීජ පැළ වල හා ගස් වල පත්‍ර වලට වැළඳෙයි. මෙහිදී දිය ගැල්වුණු පුල්ලි ඇති වන අතර ඒවා එකට යාවී විශාල, නියමිත හැඩයක් නැති, තෙත් පුල්ලි බවට පත් වේ. පසුව වියළී ගොස් දුඹුරු පැහැයට හැරේ. රෝගී පත්‍ර හැකිලී වියළුණු ස්වභාවයකට පත්වේ. රෝගය වඩාත් දරුණු වුවහොත් පත්‍ර හැලී අතු පමණක් ඉතිරි වේ.



පත්‍ර මත රෝග ලක්ෂණ පෙන්වීම

### පාලනය

රෝගය පාලනය සඳහා බෙනොමිල්, කාබෙන්ඩසිම්, තයෝෆනේට් යන දිලීර නාශක වලින් ඕනෑම එකක් රෝගය සුව වන තුරු කිහිපවිටක් යෙදීම කළ යුතුය.

## කෘමි පාලනය

### පිටි මකුණා

පිටි මකුණන් ලපටි පත්‍ර, මල්, නොමේරූ ඵල හා මේරූ ඵල වලින් යුෂ උරා බොයි. හානි වූ ප්‍රදේශ කුරු වී විකෘති වන අතර ඒවායේ කළු පැහැති දිලීරයක් වර්ධනය වේ.



පිටි මකුණාගේ හානියට ලක් වූ දූරියන් ඵලයක්

පිටි මකුණාගේ හානියෙන් ඵලදාවට එතරම් හානියක් නොවුනත් එමඟින් ගෙඩිවල ගුණාත්මය අඩුවෙයි. බෝග සනීපාරක්ෂක ක්‍රම අනුගමනය කිරීම මඟින් මෙම හානිය පාලනය කර ගත හැක.

### පලතුරු මැස්සා

සාමාන්‍යයෙන් දූරියන් විශාල ගස් වලින් ලැබෙන ඵල වල පලතුරු මැස්සාගේ හානිය අඩු වුවත් කුඩා ගස්වලින් හටගන්නා දූරියන් ඵල වලට පලතුරු මැස්සාගේ හානිය ඇති විය හැකිය. මෙයට ප්‍රධාන හේතුව පහත ස්ථාන වල පලතුරු මැස්සාගේ ගහණය වැඩිපුර පැවතීමයි. ඵල මෝරණ අවස්ථාවලදී වැඩිහිටි මැස්සන් ඵල සිදුරු කර බිත්තර දැමීම නිසා හානිය සිදුවේ.

### පාලනය

ඵල ආවරණය කිරීම මඟින් සාර්ථකව පාලනය කළ හැක. ඵල මේරීමට ආසන්න අවධියේ Polysac bag භාවිතා කර ආවරණය කිරීම මඟින් මෙම හානිය පාලනය කර ගත හැකිය.

### පැළ මැක්කා

සාමාන්‍යයෙන් ඵල වල පොත්ත සූරා කෑ බවක් දක්නට ලැබේ. මෙමඟින් ඵලයේ අභ්‍යන්තරයට බලපෑමක් නැතත් ඵලයේ බාහිර පෙනුම අඩු වේ.



පැළ මැක්කාගේ හානියට ලක් වූ දූරියන් ඵලයක්

## දූරියන් ඇට විදින්නා

මැලේසියාව වැනි රටවල දූරියන් ඇට විදින්නා වඩාත් හානි දායක පසු අස්වනු කෘමි පලිබෝධකයෙක් ලෙස සැලකේ. මේ නිසා ඇතැම් විට අස්වැන්නෙන් 50% ක් පමණ ඉවත දැමීමට සිදුවන අවස්ථා ඇති බව වාර්තා වේ. නමුත් ශ්‍රී ලංකාවේ මෙම හානිය එතරම් වාර්තා වී නොමැත. ගැහැණු සතා ගෙඩිය මතුපිට බිත්තර දමන අතර එම බිත්තර වලින් බිහිවන කීටයන් ගෙඩිය තුළට ඇතුළු වී ක්‍රමයෙන් ඇටය දක්වා ගමන් කරයි. ආලෝක උගුල් භාවිතය, ඇම යෙදීම මඟින් මෙම හානිය පාලනය කර ගත හැකිය.

## දූරියන් සිලිඩ්

මෙම කෘමියා දූරියන් වල ඉතා විනාශකාරී කෘමි පලිබෝධකයෙක් ලෙස සැලකේ. ශිශුවා සහ සුහුඹුලා යන දෙදෙනාම පත්‍ර වල යුෂ උරා බීමෙන් හානි සිදුකරයි. පත්‍ර විකෘති ස්වභාවයක් ගන්නා අතර ඔවුන්ගෙන් නිකුත්වන ශ්‍රාවයක් හේතුවෙන් පසුව කළු පැහැති දිලීරයක් වර්ධනය වේ. තදබල ලෙස හානි වූ පත්‍ර මැරී හැලී යයි. මේ නිසා ගසේ ඵල හට ගැනීම අඩුවේ. සාමාන්‍ය කෘමි නාශකයක් යෙදීමෙන් පාලනය කළ හැක.

## කොරපොතු කෘමියා

අතු, පත්‍ර සහ පුෂ්පවල යුෂ උරා බොන අතර ඔවුන්ගෙන් නිකුත්වන ශ්‍රාවයක් හේතුවෙන් හානි වු ස්ථානවල කළු පැහැති දිලීරයක් වර්ධනය වේ. මෙම හානිය වැඩි වූ විට ශාකය මැරී යාමටද හැකිය.



කොරපොතු කෘමි හානියට ලක් වූ අතු



කොරපොතු කෘමි හානියට ලක් වූ පත්‍රයක්



කොරපොතු කෘමි හානියට ලක් වූ ශාකයක්

මෙම සතාගේ හානිය දේශගුණික තත්ත්වය අනුව අඩු වැඩි වීමක් පෙන්නුම් කරයි. ඉමිඩක්ලොප්‍රිඩ් වැනි කෘමිනාශකයක් යෙදීමෙන් පාලනය කළ හැකිය.

## පොත්ත සිදුරු කරන්නා

*Batocera rufomaculata* නම් කුරුමිණියාගේ කීට අවස්ථා නිසා මෙම හානිය ඇති වේ.




පොත්ත සිදුරු කරන කුරුමිණියා

ගස පාමුල ඇති සිදුරු මඟින් හා ගස වටා ඇති තෙත් ලී කුඩු වැනි කොටස් මඟින් ගසේ මෙම හානිය ඇති බව නිගමනය කළ හැක. කීටයා ගසේ පොත්ත සිදුරු කරගෙන යන බැවින් හානිය සිදුවූ පසු ගසේ වැඩීමට බාධා ඇති වේ. මෙම හානිය නිසා ගස මැරී යාමට වුවද ඉඩ ඇත.

හානිය ගැන පලපුරුද්දක් ඇත්නම් කඳෙහි පාමුල සාදන ලද ගුහා හඳුනාගත හැකිය.



පොත්ත සිදුරු කරන්නාගේ හානිය



පොත්ත සිදුරු කරන්නාගේ හානිය

මෙම කීටයාගේ ආහාර ගැනීම නිසා ඔවුන්ගේ බහිස්‍රාවීය ද්‍රව්‍ය ලී කුඩු ලෙස එම ගුහා අසල සහ ගස පාමුල දක්නට ඇත.

හානිය පාලනය සඳහා නිරන්තර සුපරික්ෂාව ඉතා වැදගත් වේ. පොත්තේ ගුහා තුල ඇති පණුවන් ඉවත් කිරීම, ඉක්මන් උපදෙස් ලබා ගැනීම වැදගත්ය. මෙය මර්ධනය සඳහා ක්ලොරෝෆයිරොපොස් ඉමිඩක්ලෝප්‍රිඩ් වැනි පයිරත්‍රොයිඩ් කෘමිනාශකයක් කීටයා සිටින සිදුරු තුලට කාවැද්දීම, හානි කළ පොත්ත හොඳින් සුද්ධ කර කෘමි නාශකයෙදීම, කෘමි නාශක යෙදූ පසු වියළීම වැළැක්වීමට ආවරණය කර තැබීම. තවද කන්ඩසාන් ආලේපනය කිරීම වැදගත් වේ.

පරිනත කෘමියා කඳේ පොත්ත මත බිත්තර දමයි. කඳ මත ඇති කඩතොලුද ඒ සඳහා භාවිතා කරයි. ගස පාදස්ථය සහ කඳ හැකි පමණ පිරිසිදුව තබා ගැනීම වැදගත් වේ.


## කඳ විදින කුරුමිණියා

ඉතා කුඩා මි.මී. 5 - 6 පමණ දිග කෘමි විශේෂයකි.



කඳ විදින කුරුමිණියාගේ විශාල කරන ලද රූපයක්

කඳේ තැනින් තැන සිදුරු විදීම සිදුකරයි. මෙයට ද නිසි ප්‍රතිකාර නොකළහොත් අතු සම්පූර්ණයෙන් මිය යා හැකිය.



කඳ විදින්නාගේ හානිය

හානිය සිදුවන විට ලී කුඩු පිටතට පැමිණීම සිදුවේ. කුඩා රිකිලි වලට මෙන්ම විශාල ශාක වලටද හානි කරයි. හානිය පාලනය සඳහා නිරන්තර සුපරීක්ෂාව වැදගත් වේ. නිර්දේශිත කෘමිනාශක යෙදීම මඟින් පාලනය කළ හැකිය.

## මල් සිදුරු කරන දළඹුවා

දූරියන් මල් පොහොට්ටු කාලයේදී දළඹුවන් විසින් පුෂ්පයේ දළ පත්‍ර සහ පරාග කොටස් උමං සාදා කා දැමීම සිදු කරයි.



මල් සිදුරු කරන දළඹුවාගේ හානිය

හානි සිදු කිරීම රාත්‍රී කාලයේදී බහුලව සිදුවේ. නිර්දේශිත කෘමිනාශකයක් භාවිතා කිරීමෙන් පාලනය කර ගත හැක.

## කායික රෝග

### ගෙඩි ඉදීමේ අසමානතාවය

මෙය දූරියන් වල දක්නට ලැබෙන තත්ත්වයකි. මෙහිදී ඵලය ඉදීමේදී ඇතැම් මදුලුවල මාංශල කොටස් මෘදු නොවී තද ස්වභාවයෙන්ම පවතී. ඒවායේ සුවඳක් හෝ රසයක් නොමැති අතර අනෙක් කොටස් හොඳින් ඉදී රසවත්ව ආහාරයට ගත හැක. ඇතැම් විට ගෙඩියේ ඉතා කුඩා කොටසක පමණක් මෙම තත්ත්වය ඇති විය හැකි අතර සමහර අවස්ථාවල මුළු ගෙඩියේම දක්නට ඇත.

බොහෝ විට ගෙඩියේ බාහිරින් බැලූ විට මෙය හඳුනාගත නොහැකිය. ගෙඩිය කැපූ විට පමණක් හඳුනාගත හැකිය. මඳුලු විශාල ගණනක් සහිත විශාල ගෙඩිවල මෙය ඇතිවීමේ ප්‍රවණතාවය වැඩිය. මෙම තත්ත්වය පෝෂණ ද්‍රව්‍ය, ජලය හා පරිසර තත්ත්වයන් යන සියල්ලේම බලපෑමෙන් ඇතිවන බව විශ්වාස කෙරේ. කාබනික පොහොර යෙදීම, ඩොලමයිට් යෙදීම මෙම ගෙඩි ඉදීමේ අසමානතාවය පාලනය කර ගැනීමට උදව් වේ. බීජ මගින් හටගත් ගස් වල සමහරවිට මෙම තත්වය එයට ආවේණික ලක්ෂණයක් ද විය හැකිය.

## මධ්‍යස්ථයේ ජලීය ස්වභාවයක් ඇති වීම

මෙය ඵලය මැද කොටසේ හා මඳුලු වල මාංසලයේ ඇතිවන අධික ජලීය ස්වභාවයයි. මෙය සුලු වශයෙන් පවතින විට මඳුලු පල්පයට සම්බන්ධ වන ස්ථානයේ පමණක් මෙම ස්වභාවය පවතින අතර දැඩිව හටගත් විට මුළු මාංසලයම මෘදු ස්වභාවයක් ගනී. මෙම කායික තත්ත්වය ඇති වීමට ප්‍රධාන හේතුව වන්නේ අස්වැන්න නෙලීමට ආසන්න කාලයේ අධික ලෙස වර්ෂාව ඇති වීමයි. පසේ ඉහළ ජල මට්ටමක් පැවතීම හා පසේ පොටෑසියම් ඌණතාවයක් පැවතීම ද මෙයට හේතු වේ. එසේම අළුතින් ගෙඩි හටගන්නා ශාක වලට මෙය ඇති වීමේ ප්‍රවණතාවය වැඩිය.

ගෙඩිය මේරීමට මසකට පමණ පෙර පසට පොටෑසියම් පොහොර එකතු කිරීමෙන් මෙම තත්වය තරමක් දුරට මග හරවා ගත හැකිය. තද වර්ෂාවකට පසු ජලවහනය හොඳින් සිදු වීමට සැලැස්විය යුතු අතර අස්වැන්න නෙලීම ද වර්ෂාවෙන් දින 2 කටවත් පසුව සිදු කිරීම යෝග්‍ය වේ.

## මඳුලු අග පිලිස්සීම

මෙහිදී මඳුලු වල අග කොටස දුඹුරු පැහැයට හැරීම සිදු වේ. මාංශලයේ වේගවත් වර්ධනයක් ඇති වන විට පෝෂණ ද්‍රව්‍ය නිසි ආකාරයට නොලැබේ නම් හෝ මඳුලු වර්ධනය වන විට අවශ්‍ය පමණ ජලය නොලැබේ නම් මෙම තත්ත්වය ඇති විය හැකිය. මඳුලු අග පිළිස්සීම බොහෝ විට අළුතින් ඵල දරන ශාක වලත්, නියමිත කාලයට පෙර මෝරන විශාල ගෙඩිවලත්, නිරෝගී නොවන ශාකවලත් දක්නට ලැබේ.

## අහිතකර පාරිසරික තත්ත්ව නිසා ඇතිවන හානි

විශේෂයෙන්ම මෙය ඇති වන්නේ නුසුදුසු ජල වහනය, ජලයේ හිඟකම, ජලය වැඩිපුර රඳා පැවතීම හෝ අධික උෂ්ණත්වයක් පැවතීම යන කරුණු හේතුවෙනි.



**නුසුදුසු ජල වහනය නිසා ඇති වූ හානිය**

## ඵල තුනී කිරීම

බද්ධ කරන ලද ඵල දරන ගසක අස්වැන්න වැඩි වශයෙන් හටගෙන ඇත්නම් (බද්ධ ගසක ගෙඩි 150 - 200 ප්‍රමාණවත්ය) එහිදී අක්‍රමවත් ගෙඩි, පුහු ගෙඩි, ඉතා කුඩා ගෙඩි, පොකුරක වැඩිපුර ඇති (2 - 3 කට වඩා) ගෙඩි ඉවත් කළ යුතුය. ගෙඩි ඉවත් කිරීම කළ යුත්තේ දෙවන වරට ස්වභාවික ලෙස ඵල වැටීමට පසුවයි. මේ මඟින් ස්ථායි ආර්ථික අස්වැන්නක් අඛන්ඩව ලබා ගත හැකිය.

## අස්වැන්න සහ අස්වනු නෙලීම

තෙත් කලාපයේ ප්‍රධාන වශයෙන් මල් පිපීම ආරම්භ වනුයේ පෙබරවාරි මාසයත් සමඟ ඇති වන කෙටි වියළි කාලයට පසුවයි. එනම් පෙබරවාරි - මාර්තු කාලය තුලයි. නමුත් සමහර අවස්ථාවන්හිදී අගෝස්තු වියළි කාලයත් සමඟ සැප්තැම්බර් - ඔක්තෝබර් මාස තුළ ද සුළු වශයෙන් මල් හට ගැනීමක් සිදු වේ. මෙහිදී ප්‍රධාන අස්වැන්න වශයෙන් සැලකිය හැක්කේ ජුනි - අගෝස්තු මාසවල ලැබෙන අස්වැන්නයි. නමුත් උඩරට අන්තර් කලාපයේ සීමිත ප්‍රදේශයන් වල ප්‍රධාන අස්වැන්න නොවැම්බර් - පෙබරවාරි වල ලබා දෙයි.

දූරියන් වල අස්වැන්න ප්‍රභේද අනුව හා වයස අනුව වෙනස් වේ. බද්ධ ගසක අස්වැන්න ලබා දීම පැළ සිටුවා වසර 5 - 6 කින් ආරම්භ වේ. ගසේ වයස වැඩි වීමත් සමඟ අස්වැන්න වැඩි වේ. උපරිම අස්වැන්න දෙන කාලයට වයස අවුරුදු 9 - 10 බද්ධ ගසක ගෙඩි 100 - 200 හට ගන්නා අතර අවුරුදු 30 - 40 වයසැති බීජ ගසකින් ගෙඩි 300 - 500 පමණ ලැබෙන අවස්ථා ද ඇත. වසර 5 කින් පමණ අස්වනු ලැබීම ආරම්භ වන අතර වාර්ෂිකව ක්‍රමයෙන් වැඩි වේ. ලැබෙන අස්වනු ප්‍රමාණය කෘතිමව පුෂ්ප පරාගනය කිරීමෙන් වැඩි කර ගත හැකිය.

ප්‍රභේදය අනුව මල් පිපීමේ සිට ඵල මේරීම තෙක් ගත වන කාලය

| ප්‍රභේදය | දින |
|---|---|
| අඩු වයස් | 75 - 95 |
| මැදි වයස් | 95 - 120 |
| වැඩි වයස් | 120 - 140 |

ප්‍රදේශයෙහි උෂ්ණත්වය, පසෙහි සාරවත්භාවය, වගා පිලිවෙත් මත මේරීමේ කාලය සුළුවෙන් වෙනස් විය හැකිය. ඵල මේරීම පිලිබඳව අදහසක් ලබා ගැනීමට, ඵලයේ පැහැය, ඵලයට තට්ටු කිරීමේදී නැගෙන හඬ, කටුවල ස්වභාවය වැනි දේ ප්‍රයෝජනවත් වේ.

ඵලයෙහි කටු, තද කොල පැහැයේ සිට ලා කොල පැහැ වීම හෝ කොල පැහැයේ සිට කහ දුඹුරු පැහැ වීමෙන් මේරුනු ඵල හඳුනාගත හැක. මෙමඟින් මේරීම තීරණය කිරීම ඇතැම් විට අපහසු වේ.

ඇඟිල්ලකින් තට්ටු කිරීමෙන් හෝ පිහියක් හෝ කෝටුවක් කටු අතර දිවවීමේදී බොල් හඬක් නැගීමෙන් ද මේරුණු ඵල හඳුනාගත හැකිය. ඵලය නොමේරූ අවස්ථාවන්හි මෙහිදී තද හඬක් නැගේ.

ඇතැම් විට කටු වල ස්වභාවය අනුව ද ඵල වල මේරීම තීරණය කළ හැක. ඒවායේ අග දුඹුරු පැහැ වන අතර හොඳින් මේරූ ඵලවල කටු අතින් තද කිරීම හෝ තරමක් දුරට නැමීම කළ හැකිය.

දූරියන් ඉදීම ආරම්භ වන විට එයින් ආවේණික සුවඳක් නිකුත් වේ. කෙසේ වෙතත් දුර බැහැර වෙළඳපොළ සඳහා හා දිගු කාලීනව ගබඩා කර තබන්නේ නම් මීට ප්‍රථම අස්වනු නෙලිය යුතුය. ඉදී වැටෙන දූරියන් ඵල ඉතාම ප්‍රශස්ථ මට්ටමක පවතී.

දූරියන් ඵලය මේරීම, ඵලයෙහි ගුණාත්මක තත්ත්වය පිළිබඳ තීරණාත්මක සාධකයකි. දූරියන් මේරීමට පෙර හෝ පමා වී අස්වනු නෙලීමෙන් එහි රසය හීන විය හැකිය. එහෙයින් දූරියන් ප්‍රශස්ථව මෝරන අවස්ථාවේදී අස්වනු නෙලීම ඉතාමත් වැදගත්වේ. මෙහිදී පරිභෝජනය, සැකසීම, දේශීය හෝ දුරස්ථ වෙළඳපොළ, ගබඩා පහසුකම් යන කරුණු කෙරෙහි සැලකිලිමත් විය යුතුය.

වර්ෂාව නොමැති අවස්ථා වල හැර දවසෙහි ඕනෑම අවස්ථාවක දූරියන් අස්වනු නෙලිය හැකිය. දූරියන් පුෂ්ප පිපීම විවිධ අවස්ථා වල සිදුවන හෙයින් එකම අතුවල ඇති සියළුම ඵල එකවර මේරීම සිදු නොවේ. එනිසා ඵල මෝරා ඇත්දැයි අස්වනු නෙලීමට පෙර වෙන් වෙන් වශයෙන් පරීක්ෂා කළ යුතුය. දිනපතා හෝ දිනක් හැර දිනක් වශයෙන් අස්වනු නෙලිය හැකිය. එකවර අස්වනු නෙලීම සිදු නොකළ යුතුය.

අඹ, රඹුටන්, වැනි පලතුරු මෙන් නොව දූරියන් මල් හට ගනුයේ අතු වල ශාක වියන තුළය. අස්වනු නෙලීමේදී ගසට නැග කතුරක් හෝ පිහියක් මඟින් නටුව කපා පොලිසැක් මළු තුලට බහාලීමෙන් ඵලයට හානි නොවන සේ අස්වනු නෙලිය හැකිය. ඵලයේ නටුව ලණුවක ආධාරයෙන් ගසට බැඳ තැබීමෙන් ස්වභාවික ලෙස ද නෙලා ගත හැක. නමුත් තායිලන්තය වැනි රටවල වඩා ඉදුණු ඵල කෑමට ප්‍රියතාවක් නොදක්වන අතර ඔවුන් ප්‍රිය කරන්නේ බිම පතිත වීමට පෙර නටුවේ ඉහළ කෙලවර නටුවෙන් නොගැලවී පවතින අවස්ථාවය. අස්වනු නෙළීමට ප්‍රථම දින කීපයකට පෙර නටුව වටා මුදුවක් ලෙස පොත්ත ඉවත් කර තැබීමෙන් ඵල ඉදීම පහසු කර ගත හැකිය.

## පසු අස්වනු තාක්ෂණය

දූරියන් අධිකව නරක් විය හැකි පලතුරකි. එහෙයින් දූරියන් අස්වනු නෙලීමේ සිට පාරිභෝගිකයා හා දුරස්ථ වෙළඳපොළ කරා ලඟා වන තෙක් පසු අස්වනු තාක්ෂණය වැදගත් ස්ථානයක් ගනී. ආසියානු රටවල දූරියන්, වාණිජ වගාවක් වශයෙන් වගා කරන නමුත් දූරියන් පසු අස්වනු තාක්ෂණය පිළිබඳ වැඩි වශයෙන් කරුණු සඳහන්ව නැත.

දූරියන් මුඳුලු වෙන් කර අධි ශීතකරණ තත්ත්ව යටතේ ගබඩා කර වැඩි කාලයක් ගබඩා කර තබා ගත හැක. මදුලු සාමාන්‍ය සීතල තත්ත්ව යටතේ සතියක් පමණ පහසුවෙන් ගබඩා කර තබා ගත හැක.



ශීත කල තත්ත්ව යටතේ ගබඩා කර ඇති දූරියන් මුදුලු

## ඵල තේරීම

අස්වනු සැකසීමේදී ඵල තේරීම කළ යුතුය. එනම් අස්වනු නෙලූ පසු අස්වැන්නෙහි ගුණාත්මයෙහි බොහෝ වෙනස්කම් දක්නට ඇත. එනම් අස්වාභාවික හැඩයන්, විවිධ විශාලත්වයන්, නටුව කැඩුණු, නටුව ගැලවීමට ආසන්න වූ, ඵලයෙහි කටු නැමුණු, රෝග ආසාදනය වූ හෝ පිටි මකුණන් හා කොරපොතු කෘමීන් හානි කරන ලද ඵල ආදිය වේ. දිනපතා ඵල තේරීම කළයුතු අතර, තෝරා ඉවත් කරන ලද ඵල අඩු මුදලකට පරිභෝජනය සඳහා හෝ සැකසූ නිෂ්පාදන සඳහා අලෙවි කළ හැකිය.

## ශ්‍රේණිගත කිරීම

දූරියන් වගා කරන ආසියානු රටවල ශ්‍රේණිගත කිරීම පිළිබඳ සම්මත ක්‍රමයක් දැනට නොමැත. වගාකරුවන් වෙළඳුන් හා අපනයනකරුවන් දූරියන් ශ්‍රේණිගත කිරීමේ වැදගත්කම පිළිබඳව දන්නා අතර, දූරියන් වල ප්‍රමාණය අනුව ශ්‍රේණිගත කෙරේ. ශ්‍රේණිගත දූරියන් මිල ඒකාකාරී විය යුතුය. තායිලන්තය වැනි රටවල දූරියන් වගාකරුවන් වෙළඳපොළ අවශ්‍යතාවයට අනුව දූරියන් ශ්‍රේණිගත කරනු ලබයි. නිදසුන් වශයෙන් යුරෝපය, කැනඩාව හා එක්සත් රාජධානිය වැනි රටවල කි.ග්‍රෑ. 2.5 - 3.5 ඵල සඳහා ප්‍රියතාවයක් දක්වයි. එවැනි ඵල කිලෝ ග්‍රෑම් 10 - 12 ක් පමණ වූ ප්‍රමාණයකට අසුරනු ලැබේ. හොංකොං වැනි රටවල කිලෝ ග්‍රෑම් 2 - 4 ක් වූ ඵල වලට ප්‍රියතාවයක් දක්වන අතර, මෙවැනි ඵල කිලෝ ග්‍රෑම් 35 - 50 ක් පමණ උණ බම්බු ඇසුරුම් වල අසුරනු ලැබේ. සිංගප්පූරුව හා මැලේසියාව වැනි රටවල් කිලෝ ග්‍රෑම් 2 - 5 ක් වූ ඵල උන බම්බු ඇසුරුම් වලට, ලී ඇසුරුම් වලට හා ට්‍රක් රථවල ලිහිල් ලෙස අසුරනු ලැබේ.

## දූරියන් අස්වනු ගබඩා කිරීම

දූරියන් ඵල 85% ක් මේරූ අවස්ථාවේදී අස්වනු නෙලූ පසු කාමර උෂ්ණත්වයෙහි එනම් සෙන්ටිග්‍රේඩ් අංශක 25 - 30 දක්වා උෂ්ණත්වයෙහි දින 3 - 6 ක් පමණ ගබඩා කළ හැකිය. මෙසේ ගබඩා කිරීම ප්‍රභේද අනුව වෙනස් වේ. හොඳින් ඉදුණු ඵල දින 1-2 ක් හෝ වැඩි දින ගණනක් කල් තබා ගත හැකි නමුත් මාංශලය ඉතාමත් මෘදු වන අතර, ඵලයෙන් අධික සැර සුවඳක් නිකුත් වේ. තායිලන්තයේ දූරියන් ඵලයෙහි නටුව නැවුම්ව තිබීම පාරිභෝගිකයාගේ සිත් ඇද ගැනීම සඳහා වැදගත් වන කරුණක් හෙයින් එහි ඡේද ස්ථරයට (ස්වභාවික ලෙස ගිලිහෙන ස්ථානයට) මදක් ඉහලින් නටුව කපා අස්වනු නෙලා ගනු ලැබේ. බොහෝ දූරියන් වගාකරුවන් හා වෙළඳුන් ඵලයෙහි ඡේද ස්ථරයට හානි නොවීමට කෙසෙල් කොළ හෝ පත්තර වලින් එතීම කරනු ලැබේ. මෙසේ නටුව එතීමෙන් ඵලයෙහි

නැවුම් බවක් පෙන්නුම් කරන අතර, නටුව විවෘතව තිබීමෙන් ජලය ඉවත් වී යයි. පිලිපීනය, මැලේසියාව සහ ශ්‍රී ලංකාව වැනි රටවල්වල ගසින් ඉදී වැටුණු ඵල වලට වඩා ප්‍රියතාවයක් ඇත.

## ඇසිරීම

දේශීය හා දුරස්ථ වෙළඳපොළ අනුව නොයෙක් ආකාරයේ ඇසුරුම් හා බඳුන් භාවිතා කෙරේ. ආසියානු රටවල උන බම්බු ඇසුරුම්, දේශීය වෙළඳපොළ සඳහා විශාල වශයෙන් පාවිච්චි කෙරේ. උන බම්බු ඇසුරුම් ලාභදායිවත්, ලබා ගැනීමට පහසුවීමත් මෙයට හේතුවිය හැකිය. එක් උන බම්බු ඇසුරුමක කිලෝ ග්‍රෑම් 30 - 50 ක් පමණ ඇසිරිය හැකිය. කෙසේ වෙතත් ඵල එකිනෙක මත ගැටීම නිසාත්, උන බම්බු ඇසුරුම් එතරම් ශක්තිමත් නොවීම නිසාත් දූරියන් ඵල උන බම්බු අසුරුම් වල ඇසිරීමේදී පහසුවෙන් හානිවීමට බඳුන් විය හැකිය. එසේ වුවත් සමහර අපනයනකරුවන් සිංගප්පූරුව, හොංකොං වැනි දුරස්ථ වෙළඳපොළ කරා ගෙනයාමට ද මෙම ඇසුරුම් යොදා ගනී. ලී වලින් තැනූ ඇසුරුම් ද භාවිතා කරනු ලැබේ. දුරස්ථ වෙළඳපොළ කරා ඇසිරීම සඳහා වඩාත් සුදුසු රැලි ගැසුණු පෙට්ටි ප්‍රයෝජනයට ගැනීමය. මෙම ඇසුරුම් සම්මත ඇසුරුම් වන අතර, ලොවම පිලිගෙන ඇත. ඵලයේ ප්‍රමාණය අනුව සෑම පෙට්ටියකම ඵල 4 - 6 ක් ඇසිරිය හැකිය. කාඩ්බෝඩ් මඟින් වෙන්කර තැබීමෙන් ප්‍රවාහනයේදී ඵල එකනෙක මත ගැටීම අවම කර ගත හැකිය.

## ප්‍රවාහනය කිරීම

ඵල ඉදී වැඩිවීම, කුණු වීමට බඳුන් වීම හා බර අඩුවීම යන කරුණු වළක්වා ගැනීම සඳහා දූරියන් අස්වනු රැස් කල වහාම වෙළඳපොළ වෙත ප්‍රවාහනය කළ යුතුය.

## වෙළඳපොළ

දූරියන් පලතුර ද රඹුටන්, අඹ, මැංගුස් වැනි කාලයකට පමණක් සීමාවූ පලතුරකි. තවද දූරියන් කෙටි අස්වනු (මාස 2 - 3 ක් පමණ) ගෙන දෙන අතර වසරෙහි ඉතිරි කාලවල ඉතා අල්ප වශයෙන් අස්වනු ලැබේ. මෙයට අමතරව දූරියන් කෙටි ජීවන කාලයක් ඇති පලතුරක් වන බැවින් අඩු උෂ්ණත්වයක දිගු කාලයක් ගබඩා කළ නොහැකිය. මේ හේතු සාධක නිසා දූරියන් වෙළඳපොළෙහි ඇත්තේ කෙටි කාලයක් තුළ පමණි.

බොහෝ රටවල දූරියන් අස්වනු පොදු ප්‍රවාහන සේවා මගින් ප්‍රවාහනය තහනම් වනුයේ එහි ඇති සැර සුවඳ නිසාය. එවැනි රටවල ඵලයෙන් ඉවත් කරගත් මදුලු ශීතකර ප්‍රවාහනයට යොදා ගන්නා අවස්ථා ඇත.

මැලේසියාව, ඉන්දුනීසියාව, සහ පිලිපීනය යන රටවල දේශීය වෙළඳපොළ ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනයක් නොකරන අතර තායිලන්තයෙන් දූරියන් අපනයනය කෙරේ. කෙසේ වෙතත් දූරියන් නිෂ්පාදන වන, ශීත කල දූරියන් හා දූරියන් පේස්ට් වසර පුරාම අලෙවිය සඳහා ඇත.

දූරියන් වල ගුණාත්මය, අලෙවිය හා මිල කෙරෙහි බලපායි. පහළ ගුණාත්මක තත්ත්වය කායික හේතු මත සිදුවේ. එනම් නොමේරූ ඵල හා ප්‍රශස්ථ තත්ත්වයට වඩා වැඩිපුර ඉදුණු ඵල වේ. පාරිභෝගිකයන්ට මෙසේ වැඩි මිලක් දී අඩු ගුණාත්මයෙන් යුත් ඵල ආහාරයට ගැනීමට සිදුවීමෙන් වගාකරුවන්, සිල්ලර වෙළෙඳුන් හා පාරිභෝගිකයන් අතර පවතින විශ්වාසනීයත්වය අඩු වී යයි.

හොඳින් පැසී ඉදුණු දූරියන් ගෙඩියක් පාරිභෝගිකයාට හඳුනා ගැනීම සඳහා පහසුවක් වීමට පහත කරුණු ගැන සැලකිලිමත් වීම වැදගත්ය.

- සමහර හොඳින් ඉදුණු ගෙඩි සෙල වූ විට ඇතුළත මදුලු සෙලවීම ඇසේ.
- අසාමාන්‍ය ලෙස පැහැය වෙනස් වී ඇති ගෙඩි තෝරා ගැනීම.
- තවද ඉතා හොඳින් සුවඳ වහනය වීම.









පාරිභෝගිකයාට පහසුවෙන් ලබා ගත හැකි වෙළඳපොළෙහි ඇති දූරියන්

## දූරියන් නිෂ්පාදන




විජලනය කළ දූරියන්




දූරියන් ටොෆි



දූරියන් කේක්

## දූරියන් ලෙලිවලින් කඩදාසි සෑදීම



ලෙලි සිහින්ව කැපිම



තැම්බීම



තම්බා ගත් ලෙලි



වියළි පල්පය



එම කඩදාසි වලින් සාදා ගන්නා ලද නිෂ්පාදන